සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය
சுகததாச தேசிய விளையாட்டுக் கட்டிடத்தொகுதி அதிகாரசபை
SUGATHADASA NATIONAL SPORTS COMPLEX AUTHORITY

2017 වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
Annual Report

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

වාර්ෂික වාර්තාව
2017

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

1. තොරතුරු සම්බන්ධීකරණය.. 03
2. ක්‍රීඩාංගන පාලක කළමණාකාරීත්වය 03
3. අපගේ දර්ශනය සහ අපගේ මෙහෙවර.. 06
4. සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය පිහිටුවීම.. 07
5 ආයතනයේ සංවිධාන ව්‍යුහය.. 08
6. අනුමත කාර්ය මණ්ඩලය.. 09
7. මෙම අධිකාරියේ අරමුණ වගකීම් හා කාර්යයන්.. 11
8. කළමනාකරණය.. 12
9. පහසුකම් සහ සේවා සපයනු ලබන ක්ෂේත්‍ර.. 12
10. මානව සම්පත් සංවර්ධනය.. 13
11. කළමනාකාරිත්ව මණ්ඩල රැස්වීම් වාර්තාකරණය.. 14
12. 2017 වර්ෂය සඳහා සුජාක්‍රීසංඅ යේ විගණන කාර්යය.. 23
13. වාර්ෂික ප්‍රසම්පාදනය.. 23
14. සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනය.. 24
ගෘහස්ථ ක්‍රීඩාගාරය.. 24
උප ක්‍රීඩාගාරය.. 26
පිහිනුම් තටාක සංකීර්ණය.. 26
කායවර්ධන මධ්‍යස්ථානය.. 28
ක්‍රීඩා හෝටලය.. 29
15. සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනය ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය...... 30
16. සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනයේ 2018 වර්ෂය සඳහා යෝජිත සංවර්ධන ව්‍යාපෘති.................... 30
17. සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනය.. 31
18. සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනය ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය..... 32
19. සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනයේ 2018 වර්ෂය සඳහා යෝජිත සංවර්ධන ව්‍යාපෘති.................. 32
20. ආර්.ප්‍රේමදාස ක්‍රිකට් ක්‍රීඩාංගනය.. 33
21. බෝගම්බර එළිමහන් ක්‍රීඩාංගනය.. 34
22. බෙලිඅත්ත සහ වීරකැටිය පිහිනුම් තටාක.. 35
23. නුවරඑළිය තුරඟ තරඟ පිටිය.. 36
24. අමාත්‍ය මණ්ඩල සංදේශ හා ගනු ලැබූ පියවර.. 37
25. ආයතනයේ සමස්ථ ප්‍රගතිය.. 38
26. ගිණුම්කරණ ප්‍රතිපත්ති 2017 39
27. ආදායම් වියදම් ප්‍රකාශය.. 44
28. ශේෂ පත්‍රය.. 45
29. අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය.. 46
30. ක්‍රීඩාංගන අනුව ආදායම - 2017.. 47
31. විගණකාධිපති වාර්තාව හා යාවත්කාලීන තොරතුරු.. 48

තොරතුරු සම්බන්ධීකරණය

ආයතනයේ නම - සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය ප්‍රතිස්ථාපනය කිරීම නීතිමය වශයෙන් 1999 අංක 17 දරන පාර්ලිමේන්තු පනත හා 2017 අංක 14 දරණ (සංශෝධන පනත) මගින් නීතිගත කර ඇත.

කළමනාකාරීත්ව මණ්ඩලය

බ්‍රිගේඩියර් ජේඑම්එස්එස් ජයසුන්දර ආර්එස්පී,යූඑස්පී - සභාපති

කේ ඩී එස් රුවන්චන්ද්‍ර මහතා - සාමාජික
(අධ්‍යක්ෂ ජෙනරාල් - ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව)
(2017 ජුනි දක්වා)

එස් ඊ ආර් ටී එම් එස් පි බණ්ඩාර මහතා - සාමාජික
(2017 ජුනි දක්වා)

සන්ධ්‍යා සිරිමාන්න මිය - සාමාජික
(2017 ජුලි සිට)

එස් ඩබ් මදනායක මහතා - සාමාජික
(අධ්‍යක්ෂ - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව)

එස් ඊ ආර් ටී එම් එස් පි බණ්ඩාර මහතා - සාමාජික
(අධ්‍යක්ෂ ජෙනරාල් - ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව)
(2017 ජුලි සිට)

කේ ඒ ආලෝක ශ්‍රී කාන්ත මහතා - සාමාජික

අයි ආර් යූ මහේෂ් විජේරත්න මහතා - සාමාජික

ඩබ් ටී පී කබ්‍රාල් මහතා - සාමාජික

සුනිල් ගුණවර්ධන මහතා - සාමාජික

සම්පත් දිසානායක මහතා - සාමාජික

එච් එල් එම් එස් බණ්ඩාර මහතා - සාමාජික

ඒ එම් රකීබ් මහතා - සාමාජික

විගණන හා කළමනාකරණ කමිටුව

එස් ඩබ් මදනායක මහතා - සභාපති
(අධ්‍යක්ෂ - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව)

එස් ඒ ආර් ටී එම් එස් පී බණ්ඩාර මහතා - සාමාජික
(අධ්‍යක්ෂ ජෙනරාල් - ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව)

කේ ඒ ඒ ශ්‍රීකාන්ත මහතා - සාමාජික

එච් ඒ ඩබ් අභයකුමාර මහතා - සාමාජික
(ප්‍රධාන අභ්‍යන්තර විගණක - ක්‍රීඩා අමාත්‍යාංශය)

ටී එල් ටී මධුෂාණී රණවීර මිය - ලේකම්

නිරීක්ෂණ මට්ටමින් වූ සහභාගීත්වය

ඩී එස් ඒ එස් අනුලසිරි මහතා - සාමාජික
(විගණක අධිකාරී- රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව)

තුන්වන විගණන හා කළමනාකරණ කමිටුවට සහභාගි වූ නිළධාරීන්
එස් ටී රත්නායක මහතා
(විගණක අධිකාරී- රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව)

ගාමිණී චන්ද්‍රසිරි මහතා - ලේකම් (වැ.බ.)

විගණනය

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
අංක 306/72, පොල්දුව පාර,
බත්තරමුල්ල.

මාණ්ඩලික නිලධාරීන්

එස් එස් කේ ගුණවර්ධන මහතා - අධ්‍යක්ෂ
චමින්ද කේ උඩකුඹුර මහතා - සහකාර අධ්‍යක්ෂ (පාලන) (2017-05-23 දක්වා)
සි අනුරාධ විදානගමාච්චි මහතා - සහකාර අධ්‍යක්ෂ (පාලන) (2017-11-01 සිට)
සි එච් ජේ රූපසිංහ මහතා - සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) (2017-04-30 දක්වා)
සමන් බණ්ඩාර පියදාස - ගිණුම් නිලධාරි (2017-03-13 සිට)
සමන් බණ්ඩාර පියදාස - සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) (2017-10-03 සිට)
ඩබ් එම් වයි ඒ විජේසූරිය මෙනවිය - සහකාර අධ්‍යක්ෂ (ක්‍රීඩා)
ගයනි දීපිකා කුමාරි මිය - සහකාර අධ්‍යක්ෂ (තාක්ෂණික) (2017 අගෝස්තු සිට)
කපිල මුනසිංහ මහතා - නීති නිළධාරී
ටී එල් ටී එම් රණවීර මෙනවිය - අභ්‍යන්තර විගණක
එච් අනෝජා ප්‍රියදර්ශනී - පරිපාලන නිලධාරී
කේ බන්දුතිලක මහතා - තොරතුරු තාක්ෂණ නිළධාරී
පි ඩී එන් ප්‍රභා කිරිඇල්ල මිය - ක්‍රීඩාංගන කළමනාකරු (එළිමහන්)
පි ඩී සම්පත් පෙරේරා මහතා - ක්‍රීඩාංගන කළමනාකරු (වෙන්කිරීම්)
මේජර් එච් පී උපාලි ගමගේ - ක්‍රීඩාංගන කළමනාකරු (ආරක්ෂක)
ඩී ඩී එස් ලියනාරච්චි මිය - ක්‍රීඩාංගන කළමනාකරු (ගෘහස්ථ)
එස් එම් අයි සිල්වා - ක්‍රීඩාංගන කළමනාකරු (බෝගම්බර)
ශානිකා ප්‍රභාෂ්වරී මෙනවිය - අලෙවි/ මිළදීගැනීම් නිළධාරී

සම්පාදනය

අධීක්ෂණය :
එස් එස් කේ ගුණවර්ධන (අධ්‍යක්ෂ)
සි අනුරාධ විදානගමාච්චි (සහකාර අධ්‍යක්ෂ - පාලන)
එච් අනෝජා ප්‍රියදර්ශනී (පරිපාලන නිළධාරී)

පරිඝණක යතුරු ලියනය :
තිළිණ සගිරංග මුතුනායක (කළමනාකරණ සහකාර)
හර්ෂණී සේනාරත්න (කළමනාකරණ සහකාර)

භාෂා පරිවර්තනය (දෙමළ,ඉංග්‍රීසි) :
එම් නුස්රාත් මහතා (රජයේ භාෂා පරිවර්තක)

මුද්‍රණය : සැලැසිනෙ රූපවාහිනී ආයතනය

බැංකුව

ලංකා බැංකුව - ග්‍රෑන්ඩ්පාස් ශාඛාව

ලිපිනය

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය,
තැ.පෙ. 2211, ආතර් ද සිල්වා මාවත,
කොළඹ 13.

දුරකථන : 011-2445677,
2384385, 2384490

ෆැක්ස් : 011-2445675

විද්‍යුත් තැපැල :
sugathadasaindoor@gmail.com

අපගේ දර්ශනය සහ මෙහෙවර

දැක්ම

ආසියාවේ පළමු පෙළේ ජාත්‍යන්තර මට්ටමේ
ක්‍රීඩා පහසුකම් සහිත ක්‍රීඩා සංකීර්ණයක් බවට
සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය පත්කිරීම
සහ
එය සතු අනෙකුත් ක්‍රීඩා සංකීර්ණ දියුණු කිරීම
තුළින් ශ්‍රී ලංකාවේ ක්‍රීඩා සංවර්ධනයට පහසුකම්
සහනදායීව ලබාදීම.

මෙහෙවර

ජාත්‍යන්තර මට්ටමේ පහසුකම් සැපයීම මගින්
ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ දියුණුවට දායකවීම සහ
ශ්‍රී ලාංකික ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කුසලතා ඔප් නැංවීමට
අවැසි පහසුකම් සහිත ප්‍රමුඛතම
ජාත්‍යන්තර සංකීර්ණයක්
බවට පත්වීම.

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය පිහිටුවීම

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය භාරකාර අරමුදලක් ලෙස 1995.02.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ක්‍රීඩා අමාත්‍යාංශයට පවරා ගනු ලැබූ අතර, 1999 අප්‍රේල් මස 20 වන දින සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියක් බවට පත්කිරීමේ 1999 අංක 17 දරන පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදි. එකී පනත 1999.09.01 දින සිට බලපාන සේ සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය ලෙස ස්ථාපිත කරන ලදි. කාලීන අවශ්‍යතාවය මත 2017 වසරේ කළමණාකාරීත්ව මණ්ඩල උපදෙස් මත මෙම පනත සංශෝධනය කිරීමට කටයුතු කිරීමෙන් අනතුරුව 2017 අංක 14 දරණ (සංශෝධන) පනත ලෙස අගෝස්තු මස 28 දින පාර්ලිමේන්තුවේ සභා සම්මත කරන ලදි.

මෙම අධිකාරියේ කළමනාකරණ කටයුතු ක්‍රීඩා විෂය භාර අමාත්‍යවරයා විසින් පත්කරන කළමනාකාරීත්ව මණ්ඩලයක් මඟින් සිදුකරන අතර, එම මණ්ඩලය පහත සඳහන් පරිදි වේ.

1. සභාපති -ක්‍රීඩා විෂයභාර අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබේ.
2. ක්‍රියාකාරී අධ්‍යක්ෂ - ක්‍රීඩා විෂයභාර අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබේ.
3. ක්‍රීඩා විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ නියෝජිතයෙකු.
4. ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරණ ක්‍රීඩා පනත යටතේ පත්කරනු ලබන අධ්‍යක්ෂ ජනරාල්.
5. භාණ්ඩාගාරයේ නියෝජිතවරයෙකු.
6. මීට අමතරව ක්‍රීඩා විෂයභාර අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයින් 07 දෙනෙකුගෙන් සමන්විත වන අතර, ඉහත සඳහන් ක්‍රියාකාරී අධ්‍යක්ෂ තනතුර සඳහා සාමාජිකයන් අතරින් එක් අයෙකු පත්කරනු ලැබිය හැක.

.


සභාපති
ක්‍රියාකාරී අධ්‍යක්ෂ
අධ්‍යක්ෂ
HM (1-1)
MM (1-3)
JM (1-1)
MA (2-1)
MA (1-1)
PL (3)
PL (2)
PL (1)

අනුමත කාර්ය මණ්ඩලය

කළමනාකාරිත්ව මණ්ඩල සාමාජිකයින්ට අමතරව ආයතනයේ අනුමත බඳවාගැනීමේ පටිපාටියේ පරිදි ස්ථිර මුළු සේවක සංඛ්‍යාව 343ක් වේ. 2017.12.31 දිනට එම අනුමත සේවක සංඛ්‍යාවෙන් ආයතනයේ සේවය කළ සේවක සංඛ්‍යාව 94%ක් පමණ වේ. එය පහත පරිදි සවිස්තරාත්මකව දැක්විය හැකිය.

	තනතුර	වැටුප් කාණ්ඩය	අනුමත ස්ථිර සේවක සංඛ්‍යාව	කොන්ත්‍රාත් පදනම මත අනුමත සේවක සංඛ්‍යාව	2017.12.31 දිනට සේවක සංඛ්‍යාව	2017.12.31 දිනට කොන්ත්‍රාත් පදනම මත සේවක සංඛ්‍යාව	පුරප්පාඩු/ අතිරික්තය
	සභාපති		1	-	1	-	0
	ක්‍රියාකාරී අධ්‍යක්ෂ		1	-	1	-	0
	ජ්‍යෙෂ්ඨ මට්ටමේ කළමනාකරු						
	අධ්‍යක්ෂ	HM 1-1	1	-	1	-	0
	මධ්‍යම මට්ටමේ කළමනාකරු						
	නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (පාලන)	MM 1-3	1	-	0	-	1
	නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය)		1	-	0	-	1
	නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (ක්‍රීඩා)		1	-	1	-	0
	නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (තාක්ෂණික)		1	-	1	-	0
	නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ		1	-	0	-	1
	නීති නිලධාරී		1	-	1	-	0
	කණිෂ්ඨ කළමනාකරු						
	සභාපතිතුමාගේ පෞද්ගලික ලේකම්	JM 1-1	0	1	0	1	0
	අභ්‍යන්තර විගණක		1	-	1	-	0
	පරිපාලන නිලධාරී		1	-	1	-	0
	ගිණුම් නිලධාරී		1	-	1	-	0
	තොරතුරු තාක්ෂණ නිළධාරී		1	-	1	-	0
	නඩත්තු නිළධාරී		1	-	0	-	1
	මිළදී ගැනීමේ නිළධාරී/ අලෙවි නිළධාරී		1	-	1	-	0
	ආරක්ෂක කළමනාකරු		1	-	1	-	0
	ක්‍රීඩාංගන කළමනාකරු (ගෘහස්ථ)		1	-	1	-	0
	ක්‍රීඩාංගන කළමනාකරු (එළිමහන්)		1	-	1	-	0
	ක්‍රීඩාංගන කළමනාකරු (බෝගම්බර)		1	-	1	-	0
	ක්‍රීඩාංගන කළමනාකරු (බෙලිඅත්ත)		1	-	1	-	0

කළමනාකරණ සහකාර (තාක්ෂණික)							
	තාක්ෂණික සහකාර (සිවිල්)	MA 2-1	1	-	0	-	1
	තාක්ෂණික සහකාර (විදුලි)		1	-	1	-	0
	ගබඩා භාරකරු		3	-	3	-	0
	පොත් තබන්නා		1	-	1	-	0
කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)							
	කළමනාකරණ සහකාර	MA 1-1	31	-	31	-	1
	භූමි පාලක		1	-	1	-	0
	වැඩ පරීක්ෂක		2	-	2	-	0
	ක්‍රීඩා නිළධාරී		8	-	6	-	2
	ක්‍රීඩා පුහුණුකරුෟ		1	-	1	-	0
	ප්‍රධාන ආරක්ෂක නිළධාරී		3	-	2	-	1
	ආරක්ෂක නිළධාරී		18	-	18	-	0
	කළමනාකරණ සහකාර (ස්ථාන භාර නිළධාරී) නුවරඑළිය		1	-	0	-	1
	ආරක්ෂක නිලධාරී (පාලක) නුවරඑළිය		1	-	0	-	1
ප්‍රාථමික ශිල්පීන්							
	විදුලි කාර්මික	PL 3	1	-	1	-	0
	රියදුරු		6	-	6	-	0
ප්‍රාථමික අර්ධ ශිල්පීන්							
	වඩු කාර්මික	PL 2	3	-	3	-	0
	පෙදරේරු		3	-	3	-	0
	වැද්දුම්කරු		3	-	3	-	0
	පින්තාරු		3	-	3	-	0
	පෑස්සුම්කරු		3	-	3	-	0
	බයිසිකල් පණිවිඩකරු		2	-	2	-	0
ප්‍රාථමික අර්ධ ශිල්පීන් නොවන							
	ක්‍රීඩාංගන සහායක	PL 1	111	-	107	-	4
	ආරක්ෂක නියාමක		108	-	101	-	7
	කාර්යාල කාර්ය සහායක		10	-	9	-	1
		එකතුව	**342**	**1**	**321**	**1**	**21**

අධිකාරියේ වගකීම් හා කාර්යයන්

වගකීම්

1. කළමනාකරණය කිරීම, නඩත්තු කිරීම සහ ජාතික වත්කමක් ලෙස සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය ආරක්ෂා කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

2. සියලු පහසුකම් සහ සේවා නඩත්තු කරගෙන යාම.

3. ගොඩනැගිලිවලට හා ව්‍යුහවලට අවශ්‍යවන වැඩිදියුණු කිරීම් හෝ වෙනස්කිරීම් සිදු කිරීම.

4. ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට හා විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ට ක්‍රීඩාවෙහි ස්වකීය හැකියාව වැඩි දියුණු කරගැනීම සහ ඔවුන්ගේ කායවර්ධන හා සෞඛ්‍යය වැඩිදියුණු කරගැනීමට හැකිවන සේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පනවනු ලබන කොන්දේසිවලට යටත්ව පහසුකම් ඔවුනට ලබාදීම.

5. විශේෂයෙන්ම ග්‍රාමීය අංශවල ක්‍රීඩා වැඩි දියුණු කිරීමේ අරමුණ ඇතිව ක්‍රීඩා පිළිබඳ පුහුණු පාඨමාලා සහ වැඩසටහන් පවත්වා ගෙනයාම.

6. ජාතික හා අන්තර්ජාතික උත්සව සඳහා අවශ්‍ය පහසුකම් කළමනාකාරිත්ව මණ්ඩලය විසින් පනවනු ලබන කොන්දේසිවලට යටත්ව ලබාදීම.

7. ශ්‍රී ලංකාවේ ක්‍රීඩා සහ විනෝදාත්මක පහසුකම් වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව, ජාත්‍යන්තර සහ දේශීය ක්‍රීඩා පුහුණු සංවිධානය, ක්‍රීඩා ආයතන සමග සම්බන්ධීකරණය සහ සම්බන්ධතා ඇති කරගැනීම.

8. අප අධිකාරියේ පහසුකම් කළමනාකාරීත්ව මණ්ඩලය විසින් පනවනු ලබන කොන්දේසිවලට යටත්ව සාධාරණ ගාස්තුවකට පාසැල්වලට, තරුණ ක්‍රීඩා සමාජවලට සහ ක්‍රීඩා සංවිධානවලට සැපයීම.

කාර්යයන්

1. ඉහත වගකීම් ඉටුකරනු වස් අප අධිකාරිය විසින් පහත ක්‍රියාමාර්ග ගනු ලබන අතර, ජාතික ක්‍රීඩා සංගම්, පාසල් ක්‍රීඩා සංගම් හා රාජ්‍ය මෙන්ම පෞද්ගලික ආයතන සඳහා කළමනාකාරීත්ව මණ්ඩලය මගින් අනුමත කළ සහනදායි ගාස්තු යටතේ සේවා හා පහසුකම් සපයනු ලැබේ.

2. ජාතික හා ජාත්‍යන්තර ජවන හා පිටිය ක්‍රීඩා තරඟ සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණු කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම.

3. ජාත්‍යන්තර මට්ටමේ තරඟ දිවා කාලයේදී මෙන්ම රාත්‍රී කාලයේදී පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සැපයීම.

4. අඩු පහසුකම් සහිත පාසැල් හා ග්‍රාමීය මට්ටමේ දක්ෂතා සපිරි ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට අවශ්‍ය යටිතල පහසුකම් සපයාදීම මඟින් ඔවුන්ගේ දක්ෂතා වැඩිදියුණු කරගෙන ඉදිරියට ඒමට අවශ්‍ය පහසුකම් සැපයීම.

5. ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ පිහිනුම් තරඟ පැවැත්වීමට අවශ්‍ය පිහිනුම් හා කිමිඳුම් තටාකාංගන පහසුකම් සැපයීම.

6. විභාග, සම්මන්ත්‍රණ, සමුළු හා උත්සව, විනෝද කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

7. පුහුණු වැඩමුළු සංවිධානය කිරීම.

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ අරමුණු

1. සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය කළමණාකරණය කිරීම,නඩත්තු කිරීම,සුරැකීම සහ සංවර්ධනය කිරීම.
2. ක්‍රීඩා ආර්ථිකයේ සහ ක්‍රීඩා සංචාරක ව්‍යාපාරයේ අවශ්‍යතා සපුරාලීමට සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණයේ ක්‍රීඩා හා විනෝදාත්මක කටයුතු හා පහසුකම් වැඩි දියුණු කිරීම
3. රටෙහි ක්‍රීඩා අභිවෘද්ධිය වෙනුවෙන් සුගතදාස ක්‍රීඩා සංකීර්ණයේ පවතින පහසුකම් සැපයීම
4. සමාජ ඒකාබද්ධතාවයට හා ජාතිය ගොඩනැගීමට උපකාරී වන ක්‍රමවේද ලෙස ක්‍රීඩා හා විනෝදාත්මක කටයුතු යොදාගනු ලැබීම සහතික කිරීම .

කළමනාකරණය

පහසුකම් සහ සේවා සපයනු ලබන ක්ෂේත්‍ර

දිවා කාලයේ මෙන්ම රාත්‍රී කාලයේදී ද පහසුකම් සහ සේවා සැපයීමේ සුවිශේෂ හැකියාවන් සතු සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය ක්‍රීඩා, සෞඛ්‍ය, අධ්‍යාපන මෙන්ම විනෝදාස්වාද යන ක්ෂේත්‍ර සඳහා පහසුකම් සහ සේවා සැපයීමෙන් ජාතික වශයෙන් අති විශාල දායකත්වයක් දරයි. විශේෂයෙන්ම ක්‍රීඩා ක්ෂේත්‍රය සඳහා ජාත්‍යන්තර මට්ටමේ සේවා සහ පහසුකම් සැපයීමේ ප්‍රමුඛතම ආයතනය සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියයි.

ක්‍රීඩා

මලල ක්‍රීඩා, රගර්, දැල්පන්දු, ක්‍රිකට්, පැසිපන්දු, ස්කොෂ්, අත්පන්දු, බැඩ්මින්ටන්, මේසපන්දු, ජුඩෝ, මල්ලවපොර, වුෂූ, බොක්සිං, ටයිකොන්ඩෝ, කරාතේ, ජිම්නාස්ටික් යනාදී ක්‍රීඩා සඳහා ජාත්‍යන්තර මට්ටමේ පහසුකම් සැපයීම.

සෞඛ්‍ය හා අධ්‍යාපනය

ජාතික හා ජාත්‍යන්තර උත්සව, වැඩමුළු, පුහුණු පාඨමාලා, පිහිණුම් හා ජීවිතාරක්ෂක පාඨමාලා, කායවර්ධන පාඨමාලා, සංදර්ශන, රැස්වීම් සඳහා ජාත්‍යන්තර මට්ටමේ සේවා සහ පහසුකම් සැපයීම.

විනෝදාස්වාදය

ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ මහා පරිමාණ සංදර්ශන සදහා සේවා හා පහසුකම් සැපයීම.

වෙළෙඳ ප්‍රචාරණ හා දැන්වීම්

අලෙවිකරණයට අදාළ නිශ්චල ඡායාරූප ගැනීමට සහ වීඩියෝ පට සඳහා අවශ්‍ය පසුතල ලබාදීම මඟින් සේවා සහ පහසුකම් සැපයීම. අතිශයින් ජනප්‍රිය වෙළෙඳ දැන්වීම් සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය ආශ්‍රිතව රූගත කර ඇති බව සඳහන් කළයුතුව ඇත. එමෙන්ම උසස් ප්‍රමිතියෙන් යුත් LED දැන්වීම් පුවරුවක් එළිමහන් ක්‍රීඩාංගනයේ ස්ථාපනය කර ඇත.

ඉහත සේවා සහ පහසුකම් සැපයීම සඳහා සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය පහත සඳහන් ආයතනවලින් සමන්විත වේ.

1. සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනය හා පිහිණුම් තටාක සංකීර්ණය
2. සුගතදාස ක්‍රීඩා හෝටලය
3. සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනය
4. ආර්.ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය
   (2006-11-01 දින සිට වසර තිහක කාලයක් සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට බදු දී ඇත.)
5. බෝගම්බර එළිමහන් ක්‍රීඩාංගනය
6. බෙලිඅත්ත හා වීරකැටිය පිහිණුම් තටාක
7. නුවරඑළිය තුරඟ තරඟ පිටිය

මානව සම්පත් සංවර්ධනය

2017 මූල්‍ය වර්ෂය තුළ සේවක අභිප්‍රේරණය සහ කුසලතා වර්ධනය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලද වර්ෂයකි. එම වර්ෂය තුළ පහත සඳහන් විෂය ක්ෂේත්‍රයන්ට අනුකූලව පුහුණු පාඨමාලා සහ වැඩසටහන් ලබාදීමට ඉහළ පාලනාධිකාරිය කටයුතු කර ඇත.

අ.අ.	පාඨමාලාව	කාලසීමාව	සහභාගීත්වය	මුදල (රු.)
විදේශීය පාඨමාලා				
01	Saltex Exhibition and Ground Development Training Course	From 2017-10-22 To 2017-11-05	Mr.E M T Ekanayake Mr.W M N C K Senarathne	Rs.1,027,200.00
02	Seminar on Sports Facilicity Management and maintenance For Sri Lanka in China	From 2017-07-05 To 2017-07-25	Ms.Yamuna Wijesooriya	

කළමනාකාරිත්ව වාර්තාකරණය

ආයතනික මාසික ප්‍රගතිය ක්‍රීඩා අමාත්‍යාංශය වෙත වාර්තා කිරීම අඛණ්ඩව මාසිකව සිදුකරන අතර, තුන්වන කාර්තුව අවසානයේ පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන කාර්යසාධන වාර්තාව නිසි පරිදි ඉදිරිපත් කිරීමටත්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව, අයවැය දෙපාර්තමේන්තුව, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව යන ආයතන වෙත සංඛ්‍යාංඛ දත්ත ඉදිරිපත් කිරීමටත් කටයුතු කර ඇත.

2017 වර්ෂයට අදාළ කළමනාකාරීත්ව මණ්ඩල රැස්වීම්

මෙම අධිකාරියේ අභිවෘද්ධියට අදාල තින්දු තිරණ ගැනිම කළමනාකාරීත්ව මණ්ඩලය විසින් සිදුකරන අතර, ඊට අදාළ රැස්වීම් මාසිකව පැවැත්වේ. 2017 වර්ෂයට අදාළව කළමනාකාරීත්ව මණ්ඩල රැස්වීම් 10 ක් පවත්වා ඇති අතර, එම රැස්වීම්වලදී ලබාගත් වැදගත් තිරණ පහත පරිදි ඉදිරිපත් කළ හැක.

අ.අ	දිනය	කාරණය	විස්තරය
01	2017 ජනවාරි	සුජාක්‍රීසංඅ හා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව අතර පවත්නා විදුලි යාන්ත්‍රික හා වායු සමීකරණ නඩත්තු සේවා ගිවිසුම අළුත්කිරීම සම්බන්ධව	සුගතදාස ගෘහස්ථ, එළිමහන් ක්‍රීඩාංගණ හා ක්‍රීඩා හෝටලය යන ස්ථානයන්හි විදුලි යාන්ත්‍රික හා වායු සමීකරණ නඩත්තු සේවා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මඟින් වසර 20 ක පමණ කාලයක් තිස්සේ පවත්වාගෙන යනු ලබන අතර, එම සේවා ගිවිසුම 2016-12-31 වන දිනෙන් අවසන් වන බැවින් 2017 වර්ෂය සඳහා නව සේවා ගිවිසුමක් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙතින් ඉදිරිපත් කර ඇත. ඉදිරිපත් කර තිබූ සේවා ගිවිසුම කළමනාකාරීත්ව මණ්ඩලය විසින් සාකච්ඡා කරන ලද අතර, සෑම වසරකදීම මාසික සේවා ගාස්තුව වැඩිවීම සිදුව ඇති බැවින් එහි සාරාංශයක් සකස් කර ඉදිරිපත් කරන ලෙස දන්වා සිටින ලදී. වසර 20කට ආසන්න කාලයක් මුළුල්ලේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මෙම අධිකාරියේ විදුලි යාන්ත්‍රික හා වායු සමීකරණ නඩත්තු කටයුතු සිදුකරමින් පවතින බැවින් එම ආයතනය විසින් අදාල සේවාව සම්බන්ධව ඒකාධිකාරීත්වයක් පෙන්නුම් කළ හැකි බව කළමනාකාරීත්ව මණ්ඩලය විසින් පෙන්වා දෙන ලදී. නඩත්තු හා සේවා ගිවිසුම සභාපති, සුජාක්‍රීසංඅ වෙත යොමු කළ අවස්ථාවේදී අයකර ගැනීමට යෝජිත නඩත්තු හා සේවා ගාස්තුව සම්බන්ධව සාකච්ඡා වට කිහිපයක් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සාමාන්‍යාධිකාරි (යාන්ත්‍රික හා විදුලි) හා සභාපතිවරයා සමඟ පැවැත්වූ බවත් අදාල ගාස්තු වැඩිවීම සිදුකිරීමට හේතුවූ කරුණ ලෙස 2017 වර්ෂයේ සියළු රාජ්‍ය සේවකයින් සඳහා වැඩිවීමට නියමිත වැටුප් හා අතිකාල දීමනා වැඩිවීම පිළිබඳව සඳහන් කළ බවත් සභාපති, සුජාක්‍රීසංඅ විසින් කළමනාකාරීත්ව මණ්ඩලය වෙත දන්වා සිටින ලදී. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් පෙර වසරවලදී ඉටුකරනු ලැබූ කාර්යය පිළිබඳ විස්තරයක් සකස් කිරීම කළයුතු බව කළමනාකාරීත්ව මණ්ඩලය දන්වා සිටි අතර, එම ආයතනය විසින් ඉටුකරනු ලබන නඩත්තු කාර්යයන් නියමිත ප්‍රමිතියෙන් හා ගුණාත්මක භාවයෙන් යුක්තව සිදුකරන්නේද යන්න නිරීක්ෂණය කළයුතු බවත් දන්වා සිටින ලදී. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් දේශිය / විදේශිය ක්‍රීඩා ඉසව් හා වෙනත් උත්සව සඳහා සේවා දායකත්වය ලබාදී ඇති අතර, කිසිදු අවස්ථාවක එම සේවාවට අදාලව සේවා දායකයින් විසින් පැමිණිලි කිරීමක් සිදුකර නොමැති බවද කළමනාකාරීත්ව මණ්ඩලය වෙත දන්වා සිටි අතර, එම ආයතනය විසින් ඉටු කරනු ලබන සේවා හා නඩත්තු කටයුතු පිළිබඳව සෑහීමකට පත්විය හැකි බව සභාපති, සුජාක්‍රීසංඅ විසින් දන්වන ලදී. ලබන වසරේ විදුලි යාන්ත්‍රික හා වායු සමීකරණ නඩත්තු සේවා සඳහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සමඟ නව ගිවිසුමක් අත්සන් කිරීමට සිදුවේනම් අදාල කොන්ත්‍රාත්තුව පිළිබඳව විශ්ලේෂණය කර වාර්තාවක් සකස් කිරීමට හා 03වන පාර්ශවයකින් එම සේවාව සපයා ගැනීමට ඇති හැකියාව සම්බන්ධවද සොයා බලන ලෙස සහකාර අධ්‍යක්ෂ (තාක්ෂණ) වෙත උපදෙස් දෙන ලදී.

			2017 වර්ෂය සඳහා ලබාදී තිබෙන යෝජිත ගිවිසුමෙහි අඩංගු මාසික සේවා ගාස්තුව - රු1,500,000.00 (බදු රහිත) - සම්බන්ධව නැවත රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ නිළධාරීන් සමඟ සාකච්ඡා කිරීම සුදුසු බව තීරණයවූ අතර, ඒ අනුව ඉදිරි කටයුතු සිදුකිරීමට කළමනාකාරීත්ව මණ්ඩලය අනුමැතිය දෙන ලදී.
02		සුගතදාස ක්‍රීඩා හෝටලය අළුත්වැඩියා හා නවීකරණයෙන් පසු නැවත සේවා සඳහා විවෘත කිරීම	සුගතදාස ක්‍රීඩා හෝටලය ආරම්භ කර වසර 20 කට වඩා වැඩි බැවින් එහි පිළිසකර කළයුතු ස්ථානයන් බොහෝ තිබූ බැවින් 2016 වර්ෂයේදී අදාල අළුත්වැඩියා කටයුතු සිදුකිරීමට සැළසුම් සකස් කරන ලද අතර, මුදල් අමාත්‍යාංශය මඟින් වෙන් කරන ලද රු මිලි 60ක විශේෂ මූල්‍ය ප්‍රතිපාදන යටතේ අළුත්වැඩියා හා නවීකරණ කටයුතු සිදුවෙමින් පවතියි. සිදුකරනු ලැබූ අළුත්වැඩියා හා නවීකරණ කටයුතු වලින් අනතුරුව 2017 මාර්තු මස 01 වන දින සිට සුගතදාස ක්‍රීඩා හෝටලය ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ මෙන්ම විවිධ උත්සව සඳහා පහසුකම් සැපයීමට නියමිතවේ. මීට ප්‍රථම ආයතනයේ ආරක්ෂක අංශයේ නිළධාරීන් යොදවා අවශ්‍ය සේවා අවශ්‍යතාවයන් ඉටුකරගන්නා ලදී. නමුත් මේවනවිට ඉතා උසස් මට්ටමේ සේවා හා පහසුකම් සැපයීමට හැකියාව ඇති බැවින්, පහත දක්වා ඇති ක්‍රමවේදයක් මඟින් එම ස්ථානයේ පරිපාලනමය කටයුතු සිදුකිරීමට හා සේවා අවශ්‍යතාවය සපුරා ගැනීමට හැකිනම් නියමිත ප්‍රමිතියෙන් යුත් සේවාවක් සැපයීමට ඇති හැකියාව සම්බන්ධව කළමනාකාරීත්ව මණ්ඩලය සාකච්ඡා කරන ලදී. **(අ)** ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් බාහිර පාර්ශයකට බඳුදීම. **(ආ)** රාජ්‍ය - පෞද්ගලික සහභාගිත්ව ක්‍රමය. **(ඇ)** ක්‍රීඩා හෝටලය සඳහා නව කාර්යය මණ්ඩලයක් කළමනාකරණ සේව දෙපාර්තමේන්තුව වෙතින් අනුමත කරවා ගැනීම. ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් බාහිර පාර්ශවයකට බදු දීම සඳහා හෝටල් කර්මාන්තය සඳහා පිළිගත් රාජ්‍ය හා පෞද්ගලික ප්‍රසිද්ධ ආයතනයන්ගෙන් යෝජනා ලබාගැනීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබාදෙන ලදී. ත්‍රිවිධ හමුදාව මඟින් හෝටල් නඩත්තු කිරීම හා පරිපාලනමය කටයුතු සිදුකිරීම මෑතක සිට සිදුකරන බැවින් එම ආයතනයන්ගෙන්ද යෝජනා ලබාගැනීම සුදුසු බවද තීරණය විය. රාජ්‍ය හා පෞද්ගලික සහභාගිත්ව ක්‍රමය තුළින්ද ක්‍රීඩා හෝටලයේ නඩත්තු හා පරිපාලනමය කටයුතු සඳහා යෝජනා ලබාගැනීම කළයුතු බවත්, මෙහිදී මූලිකත්වය ලබාදීම සිදුකළයුත්තේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ නවාතැන් පහසුකම් ලබාදීම සම්බන්ධව බැවින් ඒ සඳහා වැඩි ප්‍රමුඛතාවයක් හා අවධානයක් යොමුකරන ලෙස දන්වා සිටින ලදී. එමෙන්ම මෙම ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමට පෙර කැබිනට් මණ්ඩල අනුමැතිය ලබාගැනීමට කටයුතු කළයුතු බවද වැඩිදුරටත් දන්වා සිටින ලදී. ක්‍රීඩා හෝටලය මඟින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා නවාතැන් පහසුකම් සැපයීම ප්‍රධාන අරමුණ හා අභිප්‍රාය වන බැවින් ඒ සඳහා මූලිකත්වය දී කටයුතු කළයුතු බව සාකච්ඡා කරන ලද අතර, ක්‍රීඩා හෝටලය ලබාදීමේදී ඇති කරගන්නා ගිවිසුමට ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ නවාතැන් පහසුකම් සැපයීම සම්බන්ධව වගන්තියක් අනිවාර්යයෙන්ම ඇතුළත් කිරීම කළයුතු බවද කළමනාකාරීත්ව මණ්ඩලය තීරණය කරන ලදී. නව කාර්යය මණ්ඩලයක් ක්‍රීඩා හෝටලය සඳහා ස්ථාපිත කරන්නේ නම් ඒ සඳහා අවශ්‍යවන කාර්යය මණ්ඩලය හඳුනාගැනීම හා ඔවුන්ගේ වැටුප් හා දීමනා ගෙවීම සඳහා යන වියදම සේවය අවසන් කරන තෙක්ම ගණනය කළයුතු බවත් සහකාර අධ්‍යක්ෂ (පාලන) වෙත උපදෙස් දෙන ලදී. ඒ අනුව ක්‍රීඩා හෝටලය සඳහා සේවක ව්‍යුහය සකස් කිරීමට උපදෙස් ලබාදෙන ලදී. ක්‍රීඩා හෝටලය පවත්වා ගෙන යාම සඳහා ක්‍රමවේද කිහිපයක් හඳුනාගෙන ඒ සියල්ල විශ්ලේෂණය කිරීම සුදුසු බව කළමනාකාරීත්ව මණ්ඩලය තීරණය කරන ලදී. මීට අමතරව මෙම කරුණ සම්බන්ධව කළමනාකාරීත්ව මණ්ඩලයේදී සිදුකරන ලද සාකච්ඡාව පදනම් කර ගරු ක්‍රීඩා අමාත්‍යතුමා දැනුවත් කර, එතුමාගෙන්ද උපදෙස් ලබාගැනීම සුදුසු බව සභාපති, සුජාක්‍රීසංඅ විසින් කළමනාකාරීත්ව මණ්ඩලයට දැනුම් දෙන ලදී. ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ නවාතැන් පහසුකම් පමණක් නොව විවිධ උත්සව අවස්ථා සඳහා පහසුකම් සැපයීමද සිදුකළ හැකි බැවින් ඒ සඳහා අවශ්‍ය භෝජනාගාර පහසුකම් සැපයීමද සිදුකළ යුතුව ඇත. මත්පැන් නිකුත් කිරීමේ

			බලපත්‍රය 2008 වර්ෂයෙන් පසුව යාවත්කාලීන කිරීම සිදුකර නොමැති බැවින් හා සුගතදාස ක්‍රීඩා හෝටලය සඳහා ඊ පන්තියේ අමුත්තන්ගේ නිවාස යටතේ අනුමැතිය ලැබී ඇති බැවින්ද මිට පෙර නිකුත් කර තිබූ මත්පැන් බලපත්‍රය නැවත අළුත්කර ගැනිමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකිරීමට අනුමැතිය දෙන ලදී.
03		දසමස නිවාස ණය මුදල	කාර්යය මණ්ඩලය සඳහා ගෙවනු ලබන දසමස නිවාස ණය මුදලේ 04 වන අදියරය ගෙවීම සම්බන්ධව ඉදිරිපත් කර තිබූ කළමනාකාරීත්ව පත්‍රිකාව පිළිබඳව දීර්ඝ ලෙස සාකච්ජා කරන ලද අතර, රාජ්‍ය අංශයේ භාවිතා කරනු ලබන චක්‍රලේඛය අදාල කරගනිමින් ණය මුදල ගෙවීමටත්, සංශෝධිත ණය මුදල රු250,000/- උපරිමයක් දක්වා ගෙවීමට හා එම ණය මුදල සඳහා අවශ්‍ය මුල්‍ය ප්‍රතිපාදනය අයකරගනු ලබන ණය මුදලින් ගෙවීමටත් කළමනාකාරීත්ව මණ්ඩල අනුමැතිය දෙන ලදී.
04	*2017 පෙබරවාරි*	සුගතදාස එළිමහන් ක්‍රීඩාංගණයේ පතිත විදුලි කුළුණු අළුත්වැඩියා කිරීම හා අන්තර් ජාතික තරඟාවලි සඳහා විදුලි ධාරිතාව වැඩිකිරීම	සුගතදාස එළිමහන් ක්‍රීඩාංගණයේ පතිත විදුලි කුළුණු හතර (04) වසර 25කට වඩා පැරණි අතර, සිදුකළ යුතු නඩත්තු කටයුතු හා විදුලි උපකරණ ප්‍රතිස්ථාපනය කරමින් පවත්වා ගෙන යනු ලබයි. මෙම පතිත විදුලි කුළුණුවල යකඩ ආධාරකයන් මඟින් විදුලි බල්බ රඳවා තැබීම සිදුකර ඇති අතර, පොළවට සවිකර ඇත්තේද යකඩ ආධාරකයන් මඟිනි. මෙම යකඩ ආධාරකයන්හි පොළවට සම්බන්ධ ස්ථාන දිරා ගොස් ඇති බැවින් එම ස්ථානයන් අළුත්වැඩියා කිරීමට හෝ ප්‍රතිස්ථාපනය සිදුකිරීම කළයුතු තත්වයට පත්ව ඇති අතර, යකඩ ආධාරක පොළවට සවිකර ඇති සමහර ස්ථාන ගිලා බැස ඇත. තවද, මෙම පතිත විදුලි කුළුණු සඳහා භාවිතා කර ඇති විදුලි රැහැන් පද්ධති හා ආලෝකය සපයනු ලබන උපකරණද කල් ඉකුත්වීම නිසා භාවිතයෙන් ඉවත්කළ යුතු තත්වයේ පවති. එමෙන්ම, මෙම විදුලි කුළුණු සඳහා යොදවාගෙන ඇති විදුලි බල්බ හා ඒ සඳහා යොදාගනු ලබන අනෙකුත් උපාංග වසර 25කට පමණ පෙර යොදා ගත් ඒවා වන අතර, මේ වනවිටත් එම විදුලි බල්බ හා අනෙකුත් උපකරණ වෙළඳපොළෙන් සොයා ගැනිම අපහසුවී ඇති අතර, මිළදී ගැනීමේදී අධික මිලක් ගෙවීමටද සිදුව ඇත. පතිත විදුලි කුළුණුවල දැනට පවතින විදුලි ධාරා මට්ටම 600LUX වන අතර, මේවනවිට ජාත්‍යන්තර මට්ටමේ පාපන්දු / රග්බි තරඟාවලි සඳහා යොදා ගනු ලබන විදුලි ධාරා මට්ටම 1200 - 1700 LUX තිබිය යුතුවේ. දැනට පවතින විදුලි ධාරා මට්ටමේ ක්‍රීඩා කරනු ලබන විට ක්‍රීඩකයාගේ හෙවණැලි 03ක් දර්ශණය වීම සිදුවන අතර, විදුලි ධාරා මට්ටම වැඩි දියුණු කිරීම සිදුකරනු ලැබුවහොත් හෙවණැලි දර්ශණය වීමද සිදුනොවේ. ඉහත සඳහන් කර ඇති අයුරින් විදුලි රැහැන් හා විදුලි බල්බ ප්‍රතිස්ථාපනය කිරීම සිදුකළහොත් දැනට භාවිතා කරනු ලබන විදුලි කුළුණු අළුත්වැඩියා කිරීම හෝ ප්‍රතිස්ථාපනය කිරීම වර්තමානයට සුදුසු අයුරින් සිදුකළ යුතුවේ. පතිත විදුලි කුළුණුවල දැනට පවතින තත්වය පිළිබඳ ශක්‍යතා වාර්තාවක් හා සිදුකළ යුතු වැඩි දියුණු කිරීම් පිළිබඳව විස්තරද රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙතින් ලබාගැනීමට අවශ්‍ය කටයුතු දැනටමත් සිදුකර ඇති බව සහකාර අධ්‍යක්ෂ (තාක්ෂණ) විසින් කළමනාකාරීත්ව මණ්ඩලය වෙත දැනුම් දෙන ලදී. මේ සඳහා ඉංජිනේරු ඇස්තමේන්තුව සකස් කිරීම මධ්‍යම ඉංජිනේරුමය උපදේශක කාර්යාංශය මඟින් ඉටුකරවා ගැනීමට කටයුතු යොදා ඇත. දැනට පවතින තත්වය හා ඉදිරියේදී සිදුකළ යුතු වැඩිදියුණු කිරීම් සම්බන්ධව පැහැදිලිව කරුණු ඉදිරිපත් කිරීම වැදගත් බව කළමනාකාරීත්ව මණ්ඩලය දන්වා සිටි අතර, ක්‍රීඩා පිටිය අළුත්වැඩියාව හා මීටර් 400 ධාවන පථය නැවත ඇතිරීමේ කටයුතු සිදුවන අතරතුර ක්‍රීඩක ක්‍රීඩිකාවන්හට ජාත්‍යන්තර මට්ටමේ යටිතල පහසුකම් ලබාදීම සඳහා අනෙකුත් අවශ්‍යතාවයන්ද වර්තමානයට ගැලපෙන අයුරින් සකස් කිරීම සුදුසු බවද කළමනාකාරීත්ව මණ්ඩලය විසින් සාකච්ජා කරන ලද අතර, ඒ සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකිරීමට කළමනාකාරීත්ව මණ්ඩලය විසින් අනුමැතිය දෙන ලදී. මෙම ව්‍යාපෘතිය සඳහා දළ වශයෙන් රු මිලි 220ක් පමණ වැය වනු ඇතැයි අපේක්ෂා කරන අතර, පතිත විදුලි කුළුණු අළුත්වැඩියාව සම්බන්ධ යෝජිත ව්‍යාපෘතිය සඳහා මුල්‍ය ප්‍රතිපාදන වෙන් කර ගැනිම පිළිබඳව මුදල් අමාත්‍යාංශය සමඟ සාකච්ජා කරමින් පවතින බවත්, ව්‍යාපෘති යෝජනාව මුදල් අමාත්‍යාංශයේ ජාතික සැළසුම් අංශය වෙත යොමුකර ඇති බවත් සභාපති, සුජාක්‍රීසංඅ විසින් කළමනාකාරීත්ව මණ්ඩලය වෙත දන්වා සිටින ලදී.

05		මු රෙ 135 යටතේ මුදල් පාලනය සම්බන්ධ කාර්යයන් පවරා දීම - 2017	2017 වර්ෂය සඳහා අනුමත අයවැය ඇස්තමේන්තුවේ සළසා ඇති ප්‍රතිපාදන ඇතුළත් මුදල් වියදම් කිරීම හා ආදායම් එක්රැස් කිරීම අරමුණු කරගෙන මුදල් රෙගුලාසි 135 අනුව මුදල් පාලනය සම්බන්ධ කාර්යයන් පවරා දීම කළමණාකාරිත්ව මණ්ඩලය අනුමත කරන ලදී. එමෙන්ම, වරින් වර මුදල් අමාත්‍යාංශය මඟින් නිකුත් කරනු ලබන චක්‍රලේඛයන්හි විධි විධානයන්ට යටත්ව කටයුතු කිරීම කළයුතු බවට කළමනාකාරීත්ව මණ්ඩලය උපදෙස් දෙන ලදී. අතර, රා මු චක්‍රලේඛ අංක 03/2015 අනුව තත් කාර්යය අතුරු අග්‍රිමය සම්බන්ධව ක්‍රියාත්මක කිරීමටත් හා සිදුකරනු ලැබූ නඩත්තු කටයුතු හා ඒ සඳහා කැඳවූ / ඉදිරිපත් කරනු ලබන මිල ගණන් පත්‍ර 03ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් තිබිය යුතු බවත් නිවැරදි ආකාරයෙන් ඉදිරිපත් කර තිබිය යුතු බවත් කළමනාකාරිත්ව මණ්ඩලය දන්වා සිටින ලදී.
06		2017 වසන්ත සැණකෙළිය වෙනුවෙන් නුවරඑළිය තුරඟ තරඟ භූමිය බදුදීම	2017 වසන්ත සැණකෙළිය සඳහා නුවරඑළිය තුරඟ තරඟ පිටියේ පහත දක්වා ඇති කොටස් තාවකාලික බදු පදනම මත මසක කාලයක් (2017 අප්‍රේල් මස 01 වන දින සිට 30 දක්වා) සඳහා නුවරඑළිය නගර සභාව වෙත රු1,100,000/- (බදු සහිත) ලබාදීමට කළමනාකාරීත්ව මණ්ඩලය එකඟතාවය පළකරන ලදී. (අ) තුරඟ තරඟ පිටියේ ප්‍රධාන පිවිසුම් දොරටුව අසළ කොටස (ආ) ගාමිණී විද්‍යාලය ඉදිරිපස කොටස (ඇ) ලංකා විදුලි බල මණ්ඩලය ඉදිරිපස කොටස
07		සුගතදාස එළිමහන් ක්‍රීඩාංගණයේ නැවත ප්‍රතිසංස්කරණය කරනු ලැබූ පාපන්දු / රග්බි ක්‍රීඩාපිටිය නඩත්තු කර පවත්වාගෙන යාම සඳහා උපදේශක / භූමි නිළධාරියෙකුගේ සේවාව ලබාගැනීම	සුගතදාස එළිමහන් ක්‍රීඩාංගණයේ පාපන්දු / රගර් ක්‍රීඩාපිටිය අළුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතියට අදාල වන උපදේශක සේවාවට අදාල ගිවිසුම මෙම අධිකාරිය හා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම කාර්යාංශය අතර සිදුකර ඇති අතර, ව්‍යාපෘතියෙහි කාර්යයන් අවසන්වීමත් සමඟ එම ගිවිසුමේ කාල සීමාවද අවසන්වී ඇත. ව්‍යාපෘති කාල සීමාව අවසන් වුවද ක්‍රීඩාපිටිය පවත්වා ගෙන යාම සඳහා නඩත්තු කාර්යයන් අඛණ්ඩව සිදු කළයුතුවේ. එබැවින්, නැවත සකස් කරනු ලැබූ ක්‍රීඩා පිටිය මනාව පවත්වා ගෙන යාම සඳහා සුදුසුකම්ලත් උපදේශකවරයෙකුගේ හෝ භූමිපාලකවරයෙකුගේ සේවාව ලබාගැනීම අත්‍යවශ්‍ය බව දන්වා ඇති අතර, ඒ සඳහා සුදුසු අයෙකු තෝරා ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීම මඟින් ඉටුකරවා ගැනීමට සහකාර අධ්‍යක්ෂ (තාක්ෂණ) විසින් යෝජනා කර ඇත. ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් සුදුසු ආයතනයක / පුද්ගලයෙකුගේ සේවාව ලබා ගැනීමට හා අදාල උපදේශන සේවාව මාස 06ක කාලයක් මාසික කොන්ත්‍රාත් පදනම මත ලබාගැනීමටත් කළමනාකාරීත්ව මණ්ඩලයේ අනුමැතිය දෙන ලදී. ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය සමඟ දැනට තිබෙන ගිවිසුම හා ගිවිසුම් කාලය අවසන්වීමෙන් පසු සිදු කළයුතු නඩත්තු කටයුතු වෙනුවෙන් එම ආයතනය විසින් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට යෝජිත ක්‍රියාමාර්ගයන් ඇත්නම් ඒ පිළිබඳව සොයා බලා කටයුතු කිරීම සුදුසු බව කළමනාකාරීත්ව මණ්ඩලය පෙන්වා දෙන ලද අතර, විශාල ප්‍රාග්ධන මුදලක් වැයකර ඉටුකරනු ලැබූ මෙම ව්‍යාපෘතියෙහි කාර්යයන් නිසි පරිදි ඉදිරියට සිදුකරගෙන යාම අනිවාර්යයෙන්ම සිදු කළයුතු බවත් කළමනාකාරීත්ව මණ්ඩලය විසින් තීරණය කරන ලදී. එබැවින්, මේ සඳහා සුදුසුකම්ලත් නිළධාරියෙකු බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන මෙන් කළමනාකාරීත්ව මණ්ඩලය සහකාර අධ්‍යක්ෂ (පාලන) වෙත උපදෙස් ලබාදුන් අතර, අධිකාරියේ සේවක ව්‍යුහය තුළ මෙම තනතුර ඇති කිරීමටත්, බඳවා ගැනීම් පටිපාටිය සකස් කර අදාල තනතුරේ අවශ්‍යතාවය පිළිබඳව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව දැනුවත් කිරීම සිදු කරන ලෙසත් කළමනාකාරීත්ව මණ්ඩලය විසින් වැඩිදුරටත් දන්වා සිටින ලදී. එමෙන්ම පාපන්දු / රග්බි ක්‍රීඩා පිටියේ නඩත්තු කටයුතු සිදු කරගෙන යාම සඳහා ක්‍රියාකාරි සැළැස්මක් සකස් කර උපදේශක ආයතනයට හෝ පුද්ගලයා වෙත ලබාදීමටත්, ඒ අනුව ඉදිරිකටයුතු සිදුකිරීමට හා එම කාර්යයන් සියල්ල අධ්‍යක්ෂ, සුජාක්‍රීසංඅ අධීක්ෂණය යටතේ සිදුකිරීමටත් කළමනාකාරීත්ව මණ්ඩලය තීරණය කරන ලදී.

<table>
<tr><td>08</td><td></td><td>අයවැය ඇස්තමේන්තුව</td><td>මුදල් අමාත්‍යාංශය විසින් 2017 වර්ෂය සඳහා අනුමත මූල්‍ය ප්‍රතිපාදන සීමාව යටතේ කාර්යයන් සිදු කිරීමට නියමිත වියදම් ඇස්තමේන්තුව සහ වියදම් සම්බන්ධව පහත දක්වා ඇති ලේඛණ කළමනාකාරිත්ව මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.

කළමනාකාරිත්ව මණ්ඩලය ඒ පිළිබඳව සාකච්ඡා කරන ලද අතර, ඒ සඳහා කළමනාකාරිත්ව මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී.

(අ) පුනරාවර්තන වියදම්
(ආ) ප්‍රධාන ප්‍රසම්පාදන සැළැස්ම
(ඇ) ක්‍රියාකාරී සැළැස්ම

2017 වර්ෂය සඳහා සිදුකිරීමට යෝජිත ව්‍යාපෘති සියල්ලෙහි මූලධන ප්‍රතිපාදන නොලැබුණද මූලික කාර්යයන් සියල්ල සම්පූර්ණ කිරීමට කටයුතු කරන ලෙස කළමනාකාරිත්ව මණ්ඩලය අදාල අංශ භාර නිළධාරීන්හට දැනුම් දෙන ලදී.</td></tr>
<tr><td>09</td><td></td><td>තනතුරු සඳහා බඳවා ගැනීම - නීති නිළධාරී, පරිපාලන නිළධාරී සහ ගිණුම් නිළධාරී</td><td>අධිකාරියේ පරිපාලන කටයුතු ක්‍රමානුකූලව පවත්වාගෙන යාමට හා පහසුකරවීම සඳහා සේවක ව්‍යුහයට මෑතකදී ඇතුළත් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද නව යෝජිත කාර්යය මණ්ඩලය සඳහා බඳවා ගැනීම් සිදුකරන ලද අතර, එම නිළධාරීන්ගේ විස්තර පහත පරිදි වේ.

<table>
<tr><th colspan="2">නම සහ ලිපිනය</th><th>තනතුර</th><th>ජාහැ අංකය</th><th>ලබාගත් ලකුණු</th><th>බඳවා ගත් දිනය</th></tr>
<tr><td>1</td><td>කපිල මුණසිංහ මහතා
නො 444/11/2,
දෙවන පටුමඟ,
විහාර මාවත,
කඩුවෙල.</td><td>නීති නිළධාරී (MM 1 -3-</td><td>750852521 V</td><td>69</td><td>2016-12-05</td></tr>
<tr><td>2</td><td>එච් අනෝජා ප්‍රියදර්ශණී මිය
නො 2/33/24,
කොස්පැලන්වත්ත,
සුවරාපොළ,
පිළියන්දල.</td><td>පරිපාලන නිළධාරී (JM 1 - 1-</td><td>736480069 V</td><td>59</td><td>2017-01-16</td></tr>
<tr><td>3</td><td>ඩබ්ලිව්එම්පීඑස් බණ්ඩාර පියදාස මහතා
නො 103/33ඒ,
ධර්මරාජ මාවත,
මහනුවර.</td><td>ගිණුම් නිළධාරී (JM 1 - 1)</td><td>803565546 V</td><td>54</td><td>2017-03-13</td></tr>
</table>

ඉහත දක්වා ඇති නිළධාරීන් බඳවා ගැනීම කළමනාකාරිත්ව මණ්ඩලය විසින් අනුමත කරන ලදී.</td></tr>
<tr><td>10</td><td></td><td>සුගතදාස ක්‍රීඩා හෝටලය සඳහා ගෘහ භාණ්ඩ මිලදී ගැනීම</td><td>සුගතදාස ක්‍රීඩා හෝටලයේ අළුත්වැඩියා හා නවීකරණ කටයුතු අගෝස්තු මාසයේදී අවසන් කිරීමට සැළසුම් කර ඇත. ක්‍රීඩා හෝටලයේ දැනට පවතින ගෘහ භාණ්ඩ සියල්ල ඉතා අබලන් තත්වයේ පවතින බැවින් නව ගෘහ භාණ්ඩ මිලදී ගැනීමට අවශ්‍ය වන අතර, ඒ සඳහා වැය වන මුදල රු මිලි 50ක් ලෙස ඇස්තමේන්තු මඟින් ඉදිරිපත් කර ඇත. අදාල ඇස්තමේන්තුගත මුදල මෙම වසරේ ප්‍රාග්ධන මූල්‍ය ප්‍රතිපාදන යටතේ වෙන්කර නොමැති බැවින් විද්‍යුත් කාලගණක උපකරණ මිලදී ගැනීම සඳහා වෙන් කර ඇති රු මිලි 150 න් රු මිලි 50 මූල්‍ය ප්‍රතිපාදනය ගෘහ භාණ්ඩ මිලදී ගැනීම සඳහා යෙදවීමට සැළසුම් කර ඇත.

විද්‍යුත් කාලගණක උපකරණ මිලදී ගැනීමට ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කළද, සුදුසු සැපයුම්කරුවෙකු තෝරා ගැනීමට නොහැකිවීම නිසා නැවත අන්තර්ජාතික සැපයුම්කාර ආයතනයන්ගෙන් මිල ගණන් කැඳවීමට අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව තීරණය කර ඇත.

එබැවින් විද්‍යුත් කාලගණක උපකරණ මිලදී ගැනීම සඳහා වෙන්කර තිබූ ප්‍රතිපාදන වලින් රු මිලි 50 ක මුදලක් සුගතදාස ක්‍රීඩා හෝටලයේ ගෘහ භාණ්ඩ මිලදී ගැනීම සඳහා යොදා ගැනීමට කළමනාකාරිත්ව මණ්ඩල</td></tr>
</table>

			අනුමැතිය ලබාදෙන ලදි. එමෙන්ම, ව්‍යාපෘති කිහිපයක කොටස් වශයෙන් කාර්යයන් නිම කිරීම සිදු නොකරන ලෙසත් ආරම්භ කරන ලද එක් ව්‍යාපෘතියක් හෝ සම්පූර්ණයෙන්ම අවසන් කිරීමට කටයුතු කිරීම සුදුසු බවත් දන්වා සිටින ලදි. ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ වෙනත් ව්‍යාපෘතියක් සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන්කිරීමක් සිදුකිරීමට හැකිද යන්න සොයා බලන ලෙසත් කළමනාකාරීත්ව මණ්ඩලය විසින් දැනුම් දෙන ලදි.
11		සුගතදාස එළිමහන් ක්‍රීඩාංගණයේ ඉදිකර ඇති 8 බී කඩ සාප්පුව මාසික කුලී පදනම මත ලබාදීම	මෙම කඩ සාප්පු කුලී පදනම මත ලබාදීම වෙනුවෙන් කිහිපවරක් පුවත් පත් දැන්වීම් පළකර මිල ගණන් කැඳවීම සිදුකළද, එම කඩ සාප්පු මාසික කුලී පදනම මත ලබාදීමට නොහැකිවූ බැවින් ප්‍රසම්පාදන කමිටුවේ එකඟතාවය මත ප්‍රසිද්ධ ස්ථාන වල දැන්වීම් අලවා මිල ගණන් කැඳවන ලදි. එම අවස්ථාවේදිද එක් අයෙකු පමණක් ඉදිරිපත්වූ අතර, පසුව ඔහුද කඩ කාමර ලබා ගැනීම ප්‍රතික්ෂේප කරන ලදි. 8බී කඩ කාමරය ජේ එම් ජේ නැව් භාණ්ඩ ප්‍රවාහකයෝ (J M J Cargo Transport) යන ආයතනය විසින් මාසික කුලී මුදල රු 40,000/- ක් (බදු රහිත) හා ආපසු ගෙවනු ලබන ආරක්ෂිත තැන්පත් මුදල ලෙස මාස 06ක කුලී මුදල ගෙවීමටද කැමැත්ත පළකර ඇත. අප අධිකාරිය විසින් ඉදිරිපත් කර ඇති අවම ලංසු මිල රු 40,000/- (බදු රහිත) වේ. රු 40,000/- (බදු රහිත) මාසික කුලී පදනම මත වසරක කාලයක් ජේ එම් ජේ නැව් භාණ්ඩ ප්‍රවාහකයෝ (J M J Cargo Transport) බදුදීමට කළමනාකාරීත්ව මණ්ඩලය අනුමැතිය දෙන ලදි. මෙම කළමනාකාරීත්ව මණ්ඩල පත්‍රිකාව තුළ කඩ කාමරයේ ප්‍රමාණය සඳහන් නොකිරීම අඩුවක් බව කළමනාකාරීත්ව මණ්ඩලය පෙන්වා දෙන ලදි. එබැවින් ඉදිරියට කළමනාකාරීත්ව මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කිරීමේදී අවශ්‍ය දත්ත සියල්ල ඇතුළත් කිරීම වැදගත් බවද සඳහන් කරන ලදි.
12		ආතර් ද සිල්වා මාවතට මුහුණලා ඇති වෙළඳසැල් පරිශ්‍රය නැවත බදු පදනම මත ලබාදීම	ආතර් ද සිල්වා මාවතට මුහුණලා ඇති වෙළඳසැල් පරිශ්‍රය Tata Tailoring ආයතනයට වසරක කාලයකට මාසිකව රු 105,000/- ක මුදලකට බදු දී ඇති අතර, එහි බදු කාලසීමාව 2017-04-30 දිනෙන් අවසන් වේ. එම ආයතනය විසින් නැවත මෙම වෙළඳසැල් පරිශ්‍රය රු 3,000/- වැඩිකර එනම් මාසිකව රු 108,000/- (බදු රහිත) වසර එකක (01) කාලයකට බදු කාලය දීර්ඝ කිරීමක් ලබාදෙන ලෙස ඉල්ලීමක් කර ඇත. සුගතදාස එළිමහන් ක්‍රීඩාංගණයේ කඩ කාමරයක මෙන් දෙගුණයක වර්ග ප්‍රමාණයක් මෙම වෙළඳ සැලේ ඇති බැවි කළමනාකාරීත්ව මණ්ඩලය විසින් තීරණය කරන ලද අතර, ඉදිරි වසරක කාලයක් සඳහා මාසිකව රු 108,000/- ක මුදලකට (බදු රහිත) වසරක කාලයකට (01) බදුදීමට කළමනාකාරීත්ව මණ්ඩලයේ අනුමැතිය ලබාදෙන ලදි.
13		සුගතදාස එළිමහන් ක්‍රීඩාංගණයේ ඉදිකර ඇති කඩ සාප්පු මාසික කුලී පදනම මත ලබාදීම	කඩ කාමර 02ක සම්බාහන මධ්‍යස්ථානයක් පවත්වා ගෙන යාම සඳහා මාසික කුලී පදනම මත ලබාදෙන ලෙස වී පි ලෝගරාජා මහතා විසින් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති බව දන්වා තිබුණද, කළමනාකාරීත්ව මණ්ඩල පත්‍රිකාවට ඇතුළත් කළ යුතු පහත දක්වා ඇති ප්‍රධාන දත්ත කිසිවක් සඳහන් කර නොතිබීම හේතුවෙන් කළමනාකාරීත්ව මණ්ඩලය විසින් අනුමැතිය ලබා නොදෙන ලදි. කඩ කාමරයේ වර්ග ප්‍රමාණය, ඉදිරිපත් කරනු ලබන මාසික කුලී මුදල, ආරක්ෂිත තැන්පත් මුදල, පවත්වාගෙන යාමට බලාපොරොත්තු වන ව්‍යාපාරයේ ලියාපදිංචිය හා අවශ්‍ය අනෙකුත් අනුමැතින් හා ඔහු විසින් යම් නවීකරණයක් සිදුකරන්නේ නම් ඒ පිළිබඳ විස්තර ආදිය ඇතුළත් කර කළමනාකාරීත්ව මණ්ඩල පත්‍රිකාවක් නැවත කළමනාකාරීත්ව මණ්ඩලයට ඉදිරිපත් කරන ලෙස මිලදී ගැනීම් / අලෙවි නිළධාරි වෙත උපදෙස් දෙන ලදි.
14		විද්‍යුත් කාලගණක උපකරණ මිලදී ගැනීම	විද්‍යුත් කාලගණක උපකරණ මිලදී ගැනීම සඳහා ද්විත්ව කවර ක්‍රමය යටතේ ප්‍රසම්පාදන කටයුතු සිදුකරන ලද අතර, ටෙන්ඩර්කරුවන් දෙදෙනෙකු විසින් තාක්ෂණික හා මූල්‍ය යෝජනා භාරදී ඇත. සුදුසුකම් සපුරාලන ලද එක් ආයතනයක පමණක් මූල්‍ය යෝජනා විවෘත කරන ලද අතර රු මිලි 205 මුදලකට අදාල උපකරණ මිලදී ගැනීමට යෝජනා ඉදිරිපත්වී තිබුණි. තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිර්දේශ මත කාලගණක උපකරණ අතුරින් පිටියේ ඉසව් සඳහා භාවිතා කරන උපකරණ :ඍඑ- හැර ඉතිරි උපකරණ රු මිලි 135

			මිලදී ගැනීමට තිරණය විය. ඒ අනුව මෙය රු මිලි 100කට වඩා වැඩි ප්‍රසම්පාදන කටයුත්තක් බැවින් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව වෙත යොමු කිරීම සිදුකරන ලදි. අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව වෙත අවශ්‍ය වාර්තා ලබාගැනීමට නොහැකිවීමේ තත්වය තාක්ෂණ ඇගයීම් කමිටුව වෙතද දන්වා ඇත. අවසානයේදී අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් ටෙන්ඩරය අවලංගු කර නැවත ජාත්‍යන්තර සීමිත තරඟකාරී ලංසු කැඳවීම යටතේ ක්‍රීඩා අමාත්‍යාංශය විසින් සිදුකිරීමට අනුමැතිය ලබදි ඇත. ඒ ආකාරයෙන් ලංසු කැඳවීම සිදුකිරීමට සැළසුම් කළද වෙන් කර ඇති මුල්‍ය ප්‍රතිපාදනය රු මිලි 150ක් බැවින් එම මුදල ප්‍රමාණවත් වේද / නොවේද යන්න හේතුව මත නැවත මිලදී ගැනීම ගැටළු සහගත වේ. එමෙන්ම ප්‍රසම්පාදන කාර්යය වෙනුවෙන් මාස 05කට වඩා වැඩි කාලයක් ගතවන බවත්, උපකරණ නිෂ්පාදනයෙන් පසුව ගැනීමට සිදුවන නිසාත් මෙම වසර ඇතුළතදී මෙම උපකරණ මිලදී ගැනීමට හැකියාවක් නොමැති බවද නිරීක්ෂණය විය. එබැවින්, 2017 වර්ෂයේ වෙන් කරන ලද මුල්‍ය ප්‍රතිපාදනය වන රු මිලි 50 කිසිදු කාර්යයකට නොයෙදුවහොත් නැවත භාණ්ඩාගාරයට ලබගන්නා බැවින් එම මුදල යොදවා සුගතදාස ක්‍රීඩා හෝටලයට ගෘහ භාණ්ඩ මිලදී ගැනීමට යෝජනාවූ බව සඳහන් කර ඇත. මෙහිදී කළමනාකාරිත්ව මණ්ඩලය විසින් විද්‍යුත් කාලගණක උපකරණ මිලදී ගැනීම ප්‍රමාද කිරීම සම්බන්ධව දැඩි අප්‍රසාදය පළකරන ලදි. මළල ක්‍රීඩා ක්ෂේත්‍රයට ප්‍රධාන අත්‍යවශ්‍ය අංගයක් වන මෙම උපකරණ මිලදී ගැනීම අනිවාර්යයෙන්ම සිදුකල යුතු බව පෙන්වා දුන් අතර, මෙම උපකරණ නොමැතිව ක්‍රීඩකයෙකු විසින් වාර්තාවක් පිහිටවුවහොත් එම පිහිටුවන ලද වාර්තාව පිළිගැනීමක් සිදුනොකරන බවද දන්වා සිටින ලදි. මුල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන්නේ නම් ධාවන තරඟ සඳහා භාවිතා කරනු ලබන උපකරණ, පිටිය ඉසව් සඳහා භාවිතා කරනු ලබන උපකරණ හා පිහිණුම් තටාකය සඳහා භාවිතා කරනු ලබන උපකරණ වෙන් වෙන් වශයෙන් මිලදී ගැනීමට යෝජනාවූ අතර, ඒ සඳහා කළමනාකාරිත්ව මණ්ඩලය අනුමැතිය ලබා දෙන ලදි. 2016 වර්ෂයේ වෙන් කරන ලද විශේෂ මුල්‍ය ප්‍රතිපාදන තුළ රු මිලි 100 ක් ඇති බවත්, එම මුදල යොදවා මළල ක්‍රීඩා හා පිහිණුම් ඉසව් සඳහා අවශ්‍ය වන කාලගණක උපකරණ වලින් කොටසක්හෝ මිලදී ගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරන බවත් සභාපති, සුජාක්‍රීසංඅ විසින් කළමනාකාරිත්ව මණ්ඩලය වෙත දැනුම් දෙන ලදි.
15		ක්‍රියාකාරී අධ්‍යක්ෂ තනතුර සඳහා පත් කිරීම	සංශෝධිත අධිකාරී පනත නීතිපති දෙපාර්තමේන්තුව විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලභාවය තහවුරු කර තිබුණද, පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට ඇති හෙයින් මෙම අධිකාරියේ ක්‍රියාකාරී අධ්‍යක්ෂක තනතුර සඳහා ආලෝක ශ්‍රී කාන්ත මහතා පත් කිරීම කළමනාකාරිත්ව මණ්ඩලය විසින් අනුමත නොකරන ලදි.
16	2017 ඔක්තොම්බර්	එළිමහන් ක්‍රීඩාංගණයේ ස්ථාපිත කිරි අලෙවි සැලෙහි බිම් කුලිය සඳහා වූ මාසික කුලි මුදල් සංශෝධනය හා නව සේවා ගිවිසුම සම්බන්ධවයි	2008 වසරේ සුගතදාස එළිමහන් ක්‍රීඩාංගණයේ ස්ථාපිත කර ඇති කිරි අලෙවි සැලෙහි මාසික කුලි මුදල රු3,000/- (බදු සහිත) ලෙස මේ දක්වා ගෙවාගෙන යනු ලබන අතර, ජල / විදුලි පරිභෝජනය සඳහා එම ආයතනය විසින් අදාල මාසික කුලි මුදල් ගෙවනු ලබයි. 2008 වර්ෂයේ සිට පවත්වාගෙන යනු ලබන කිරි අලෙවි සැලෙහි මාසික ගාස්තු සංශෝධනයක් සිදුව නොමැති බැවින් මාසිකව එහි කුලිය රු 3,500/- ක් ලෙස සංශෝධනය කිරීමට යෝජනා කර තිබුණද, එම සංශෝධිත මාසික කුලි මුදලෙහි අගය පිළිබඳව කළමනාකාරිත්ව මණ්ඩලය පහත දක්වා ඇති කරුණු හේතුවෙන් එකඟ නොවන බව දන්වා සිටින ලදි. (i) 2008 වර්ෂයේ මෙම කිරි අලෙවි සැල ආරම්භ කරනු ලැබුවත් 2017 වර්ෂය තෙක් මාසික කුලියේ කිසිදු වැඩිවීමක් සිදුනොවීම. (ii) වසර නවයකට පසුව රු500/- ක් වැනි සුළු මුදලකින් මාසික කුලිය සංශෝධනය කිරීම. (iii) භූමියෙහි වටිනාකමට අනුකූලව මාසික කුලියේ අගය නිර්ණය නොවීම. (iv) මෙම කිරි අලෙවි සැල ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් නොව එම ආයතනයේ වරලත් නියෝජිතයෙකු විසින් පවත්වා ගෙන යාමට කටයුතු කර තිබීම. එමෙන්ම, කොළඹ අවට හා දුම්රිය ස්ථානයන්හි මෙවැනි ආකාරයේ කිරි අලෙවි සැල් පවත්වාගෙන යන බැවින් එම ස්ථානයන්හි මාසික කුලී මුදල කොපමණද යන්න සොයා බලා අප අධිකාරියේ පවත්වාගෙන යනු ලබන

			මාසික කුලී මුදල සම්බන්ධව කිසියම් නිගමනයකට පැමිණීමට හැකි බැවින් ඒ පිළිබඳව සොයා බලන ලෙසත් කළමනාකාරීත්ව මණ්ඩලය පරිපාලන නිළධාරීනිය හට දන්වන ලදී. මෙම කිරි අලෙවි සැල පවතින භූමි කොටස රාජ්‍ය තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් තක්සේරු කිරීමෙන් අනතුරුව දැනට පවතින අවම තක්සේරු වටිනාකම පදනම්කර මාසික කුලී මුදල සංශෝධනය කිරීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකිරීමට කළමනාකාරීත්ව මණ්ඩලය විසින් අනුමැතිය දෙන ලදී.
17		සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ ආදායම සඳහා වෙනම ගිණුමක් පවත්වාගෙන යාම	3002239 අංක දරණ ලංකා බැංකුව ග්‍රෑන්ඩ්පාස් ශාඛාවේ පවත්වා ගෙන යනු ලබන මෙම අධිකාරියේ ජංගම ගිණුමෙහි ව්‍යාපෘති මුදල්, ආදායම් හා ක්‍රීඩා අමාත්‍යාංශය මඟින් ලබාදෙන මුදල් සියල්ල පැවතිම නිසා කළමනාකරණයේදී ගැටළු මතුවන බව සහකාර අධ්‍යක්ෂ (මුල්‍ය) විසින් කළමණාකාරීත්ව මණ්ඩලය වෙත දන්වා සිටින ලදී. එක් ගිණුමක් පවත්වාගෙන යාමේදී ගැටළු මතුවන බව දන්වා ඇති බැවින් තවත් නව ගිණුමක් ආරම්භ කර පවත්වාගෙන යාම සංකීර්ණ මෙන්ම ගැටළු සහිත බව වැඩිවන බවත් කළමනාකාරිත්ව මණ්ඩලය විසින් පැහැදිලි කර දෙන ලදී. නූතන තාක්ෂණයේ දියුණුවත් සමඟම මෙම අධිකාරියේ ගිණුම් කටයුතු සම්බන්ධ කාර්යයන්හිදී අදාල තාක්ෂණ ක්‍රමවේදයන් භාවිතා කිරීම තුළින් කාලය හා ශ්‍රමය අඩුවෙන් යෙදවීමට සිදුවීමත් ගණුදෙනුවක් කළ සැනින් ගිණුම් යාවත්කාලින වන බැවිනුත් අවශ්‍ය නිවැරදි තොරතුරු එම අවස්ථාවේම ලබාගත හැකි වීමත් නිසා ණීර්ණීබැංකුකරණය (E - Banking System) සඳහා යොමුවීම වැදගත් බව කළමනාකාරීත්ව මණ්ඩලය පෙන්වා දෙන ලදී. එමෙන්ම, මුදල් අමාත්‍යාංශය මඟින් මුදල් ලැබීම් හා සියළුම අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු සඳහා මුල්‍ය ප්‍රතිපාදනයන් වෙන් කිරීම සඳහා පවත්වාගෙන යනු ලබන්නේ එක් ගිණුමකින් බවද කළමනාකාරීත්ව මණ්ඩලය විසින් සහකාර අධ්‍යක්ෂ (මුල්‍ය) වෙත දැනුම් දෙන ලදී. ආදායම පවත්වාගෙන යාම සඳහා වෙනම ගිණුමක් ආරම්භ කර පවත්වාගෙන යාමට කළමනාකාරීත්ව මණ්ඩලය අනුමැතිය ලබා නොදෙන ලදී.
18		මහජන බැංකුවේ ග්‍රෑන්ඩ්පාස් ශාඛාවේ කුඩා බැංකු ඒකකයක් සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය ඇතුළත ස්ථාපිත කිරීම සහ මෙම අධිකාරියේ ආදායම සඳහා වෙනම ගිණුමක් පවත්වා ගෙන යාම	සුගතදාස ගෘහස්ථ හා එළිමහන් ක්‍රීඩාංගණයන්හි වෙන්කිරීම් සඳහා මෙන්ම ක්‍රීඩා කටයුතු සඳහා එදිනෙදා විශාල සේවාදායකයින් සංඛ්‍යාවක් පැමිණෙන හෙයින් ඔවුන්ගේ බැංකු කටයුතු සඳහා බැංකු ශාඛාවක අවශ්‍යතාවය වැඩිවෙමින් පවතින බැවින් අධිකාරියට ආසන්නයේ පිහිටි බැංකුවක් වන මහජන බැංකුව විසින් යෝජනා ඉදිරිපත් කර ඇති බව සහකාර අධ්‍යක්ෂ (මුල්‍ය) විසින් කළමනාකාරීත්ව මණ්ඩලය වෙත දන්වා සිටින ලදී. කාලයට උචිත අයුරින් බැංකු කටයුතු මෙම අධිකාරිය ඇතුළතින්ම සිදුකර ගැනීමට හැකිවීම සේවාදායකයින්ට ඉමහත් පහසුවක් වන බැවින් හා මෙම ප්‍රදේශය ඇතුලතට වෙනත් කාර්යයන් සඳහා පැමිණෙන අයවළුන් සඳහාද මෙවැනි බැංකු ඒකකයක් ඇති කිරීම සුදුසු බව කළමනාකාරීත්ව මණ්ඩලය විසින් සාකච්ජා කරන ලද අතර, ඒ සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකිරීම සඳහා රාජ්‍ය බැංකු වලින් මිල ගණන් කැඳවීමට කටයුතු කරන ලෙසත් සහකාර අධ්‍යක්ෂ (මුල්‍ය) වෙත උපදෙස් දෙන ලදී. මෙම බැංකු ඒකකය වෙත පිටතින් පැමිණෙන අයවළුන්හට ගණුදෙනු සිදුකිරීම සඳහා ආයතනයේ කටයුතුවලට බාධා නොවන අයුරින් සුදුසු ස්ථානයක සකස් කර දීමට කටයුතු කිරීම, අදාල බැංකුව සමඟ වෙළඳ ගිවිසුමක් සකස් කර ආර්ථිකමය වටිනාකමක් සහිතව ආදායම ජනනය කර ගැනීමට හැකි අයුරින් යෝජනා ඉදිරිපත් කිරීම හා ආයතනය මඟින් වසර 10 කාලයක් සඳහා උපාය මාර්ගික සැළැස්මක් (Strataegic Plan) සකස් කර ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම වැනි කරුණු කෙරෙහි අවධානය යොමුකරන ලෙසත් කළමනාකාරීත්ව මණ්ඩලය පෙන්වා දෙන ලදී. ඕනෑම රාජ්‍ය බැංකුවක් මඟින් යෝජනා ලබා ගැනීමට කටයුතු කිරීම හා එම බැංකු ශාඛාව ඉදිකර ගැනීමට යෝජිත භූමිය හඳුන්වා දීම හා අදාල බැංකු වලින් ඔවුනගේ සංවර්ධන සැළැසුම් ලබා ගැනීමට කටයුතු කිරීම. බැංකුව ඉදිකිරිමට යෝජිත භූමිය වානිජ්‍යයමය ලෙස වැදගත් වන ක්‍රීඩා හෝටලය ආසන්නයේ ඉදිකිරිමට හැකිදැයි සොයා බැලීම හා බාහිර පුද්ගලයින්හට

			කරදරයකින් තොරව තම අවශ්‍යතා ඉටුකර ගැනීමට ප්‍රවේශ විය හැකි ස්ථානයක් වීම වැදගත් බවද කළමනාකාරීත්ව මණ්ඩලය දන්වා සිටින ලදී. මේ සඳහා බදු ගිවිසුමක් හා ව්‍යුහමය සැළැස්මක් සකස් කර අනෙකුත් යෝජනා සියල්ලද ඇතුළත් කර වාර්තාවක් සකස් කර කළමනාකාරීත්ව මණ්ඩලයට ඉදිරිපත් කරන ලෙසත් දැනුම් දෙන ලදී. යෝජිත බැංකු ඒකකය ඉදිකිරීම සම්බන්ධව අදහස් / සංකල්ප ගොනුකර ඒ පිළිබඳ සංකල්පමය සැළැස්මක් (Conceptual Plan) කළමනාකාරීත්ව මණ්ඩලයට ඉදිරිපත් කර නිසි අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ඉදිරි කටයුතු සිදුකිරීමට කළමනාකාරීත්ව මණ්ඩලය තීරණය කරන ලදී. එමෙන්ම, සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ පවත්වනු ලබන මහා පරිමාණ ඉසව් සඳහා (Mega Events) මුදල් අයකිරීමේදී ණීසෘෂධී ජ්හපැබඑණී ක්‍රමවේදය අනුගමනය කිරීම සුදුසු බවත් කළමනාකාරීත්ව මණ්ඩලය සහකාර අධ්‍යක්ෂ (මුල්‍ය) වෙත උපදෙස් දෙන ලදී. ආදායම සඳහා වෙනම ගිණුමක් පවත්වාගෙන යාමට කළමනාකාරීත්ව මණ්ඩලයේ අනුමැතිය ලබා නොදෙන ලදී.
19		සුගතදාස එළිමහන් ක්‍රීඩාංගණයේ පාපන්දු ක්‍රීඩා පිටියේ උපදේශක / භූමි පාලක නිළධාරීගේ සේවා කාලය දීර්ඝ කිරීම (කොන්ත්‍රාත් පදනම මත)	සුගතදාස එළිමහන් ක්‍රීඩාංගණයේ පාපන්දු ක්‍රීඩා පිටියේ උපදේශක / භූමි පාලක නිළධාරි කේ ටී නුගවෙල මහතාගේ සේවා කාලය 2107-09-30 වන දිනෙන් අවසන් වන බැවින් සේවා අවශ්‍යතාවය මත හා ඔහු විසින් පවරන ලද සියළු රාජකාරීන් නිසි අයුරින් ඉටු කරනු ලැබූ හෙයින්ද ඔහුගේ සේවා කාලය නැවත දීර්ඝ කරගැනීම සුදුසු බව පෙන්වා දී ඇත. කේ ටී නුගවෙල මහතා වයස අවුරුදු 60 සම්පූර්ණවූ අයෙකු නිසාවෙන් සේවා දිගුවක් ලබාදීමට අනුමැතිය ලබාදිය නොහැකි බව කළමනාකාරීත්ව මණ්ඩලය දැනුම් දෙන ලදී. නමුත්, මීටර් 400 ධාවන පථය නැවත ඇතිරීමේ කටයුතු අවසන්ව නොමැති බැවින් එම කටයුතුද අවසන්වන තෙක් ක්‍රීඩාංගණයද මේ අයුරින්ම පවත්වාගෙන යාම සඳහා භූමි පාලක නිළධාරීගේ සේවය ලබාගැනීම සුදුසු බවත්, විශාල ප්‍රාග්ධන මුදලක් වැයකර අළුත්වැඩියා කර ඇති මෙම පාපන්දු ක්‍රීඩා පිටිය නියමිත ප්‍රමිතියට අනුව නඩත්තු කර පවත්වාගෙන යාම ජාතික කර්තව්‍යයක් බැවිනුත් භූමි පාලක / සහායක භූමි පාලක තනතුරු සඳහා බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබීමත් හේතුවෙන් මාසිකව ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සිදුකරමින් නැවත මාස 03ක කාලයක් සඳහා සේවා දිගුවක් ලබාදීමට කළමනාකාරීත්ව මණ්ඩලය අනුමැතිය දෙන ලදී. එමෙන්ම, භූමි පාලක / සහායක භූමි පාලක තනතුරු බඳවා ගැනීම සඳහා අවශ්‍ය අනුමැතිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් කඩිනමින් ලබාගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙසද පාලන අංශය වෙත උපදෙස් දෙන ලදී. කේ ටී නුගවෙල මහතා හට සේවා දිගුව ලබාදිය යුත්තේ කෙතරම් කාල සීමාවක් සඳහාද යන්න කළමනාකාරීත්ව මණ්ඩල පත්‍රිකාවට ඇතුළත්ව නොතිබීම විශාල අඩුපාඩුවක් ලෙස කළමනාකාරීත්ව මණ්ඩලය විසින් දන්වා සිටි අතර මින් ඉදිරියට කළමනාකාරීත්ව මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කිරීමේදී අනුමැතිය බලාපොරොත්තු වන කරුණ සඳහා අවශ්‍ය සියළු දත්ත ඇතුළත් කර ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙසත් වැඩිදුරටත් දන්වා සිටින ලදී. ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල්තුමා විසින් කේ ටී නුගවෙල මහතා මඟින් ඉටුකරනු ලැබූ කාර්යය අතිමහත් බව සඳහන් කරන ලද අතර, ක්‍රීඩාවේ යටිතල පහසුකම් වැඩි කිරීම තුළින් මළල ක්‍රීඩා ක්ෂේත්‍රයේ දියුණුවද සිදුවන බැවින්, ඔහුගේ සේවාව අනිවාර්යයෙන්ම ක්‍රීඩා අමාත්‍යාංශයට ලැබිය යුතු බවත් දැනුම් දෙන ලදී. කේ ටී නුගවෙල මහතාගේ සේවාව ක්‍රීඩාංගණ නඩත්තු කිරීම හා පවත්වාගෙන යාම සඳහා ඉදිරියටත් අවශ්‍යවේනම් සේවා අවශ්‍යතාවය සඳහන් කර පාර්ලිමේන්තුව වෙත අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීම සුදුසු බවද කළමනාකාරීත්ව මණ්ඩලය තීරණය කරන ලදී.

2017 වර්ෂය සදහා සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ විගණන කාර්යය

2017 විගණිත වර්ෂය සදහා විගණන විමසුම් 15 ක් ඉදිරිපත් වී ඇති අතර, ඒ සදහා පිළිතුරු සපයා නොමැත. විගණන කමිටුව එම වර්ෂය සදහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 02 ක් පැවැත්වීමට කටයුතු කර ඇත. ඒ අනුව,

01. අභ්‍යන්තර විගණන විමසුම් සඳහා 2017 වර්ෂයට අදාළ පිළිතුරු ලබාදී ඇති අතර, ඒවා ක්‍රියාවටද ලක්කර ඇත.

02. 2017 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන වාර්තා ගණන 08 කි.

03. ක්‍රීඩා අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 04ක් සදහා මෙම අධිකාරියේ ඊට අදාළ නිළධාරීන් සහභාගි වී ඇත.

භාණ්ඩ සමීක්ෂණය

සුගතදාස ජාතික ක්‍රීඩා සංකිර්ණ අධිකාරියේ 2017 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණය සදහා 2017.12.08 දින අනු කමිටු 10කින් සමන්විත භාණ්ඩ සමීක්ෂණ කමිටුව පත්කරන ලදී. රජයේ මුදල් රෙගුලාසි 756, 757 විධිවිධාන අනුව අවසන් කර ඇත. භාණ්ඩ අපහරණ කටයුතු සිදු කෙරෙමින් පවති.

වාර්ෂික ප්‍රසම්පාදනය

2017 මූල්‍ය වර්ෂය තුළ අධිකාරියේ ක්‍රියාකාරකම් උදෙසා සිදුකරන ලද ප්‍රසම්පාදන ක්‍රියාවලිය පහත පරිදි වේ.

අ.අ.	ප්‍රසම්පාදනය	මුදල (රු.)
	සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනය	
01	ප්‍රධාන ක්‍රීඩාගාරයේ පිටත සිවිලිම අලුත්වැඩියා කිරීම	35,000,000.00
02	ක්‍රීඩා හෝටලය නවීකරණය - අවසාන අදියර	100,000,000.00
03	ක්‍රීඩා උපකරණ මිළදී ගැනිම	15,000,000.00
04	පරිගණක හා උපාංග මිළදී ගැනිම	10,000,000.00
05	සියලුම වැසිකිලි හා නාන කාමර අලුත්වැඩියා කිරීම	44,000,000.00
06	ඉලෙක්ට්‍රොනික් කාලඝණක පද්ධතිය ස්ථාපිත කිරීම	50,000,000.00
	සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනය	
07	සභාපති බංගලාව අලුත්වැඩියාව	10,000,000.00
08	සවි කිරීම් - නව පරිපාලන ගොඩනැගිල්ල	10,000,000.00
09	රග්බි/පාපන්දු පිටිය සදහා උපකරණ මිළදී ගැනිම	20,000,000.00
10	සුළු සේවකයින් සදහා නේවාසික ගොඩනැගිල්ල ඉදිකිරීම	57,000,000.00
11	පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම - අදියර 111 (B)	31,000,000.00
12	මීටර් 400 හා මීටර් 200 කෘතිම ධාවන පථය නැවත ඇතිරීම	300,000,000.00
	බෝගම්බර ක්‍රීඩාංගනය	
13	ප්‍රධාන දොරටුව ස්ථාපනය	13,000,000.00
14	පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම	55,000,000.00
	මුළු මුදල	**750,000,000.00**

සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනය

සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනය පහත සඳහන් අංගවලින් සමන්විත වේ.

1. ගෘහස්ථ ක්‍රීඩාගාරය
2. උප ක්‍රීඩාගාර (බැඩ්මින්ටන්, ස්කොෂ් හා මේස පන්දු)
3. පිහිනුම් තටාක සංකීර්ණය
4. කායවර්ධන මධ්‍යස්ථානය
5. ක්‍රීඩා හෝටලය

ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය 2017

ජාතික ජිම්නාස්ටික් ශූරතාවලිය 2017

ගෘහස්ථ ක්‍රීඩාගාරය

ගෘහස්ථ ක්‍රීඩාගාරය ආසන 5004කින් සැදුම්ලත් වායුසමීකරණය කළ ප්‍රේක්ෂකාගාරයකින් සමන්විත වන අතර, මෙහි ගෘහස්ථ ක්‍රීඩා පිටියෙහි පළල මීටර් 35ක් හා දිග මීටර් 40ක් වේ. මෙම ක්‍රීඩාගාරයේ පැසිපන්දු, බැඩ්මින්ටන්, දැල්පන්දු, ජූඩෝ, ජිම්නාස්ටික්, වොලිබෝල්, මේස පන්දු, බොක්සිං, කරාතේ, මල්ලවපොර ආදී ගෘහස්ථ ක්‍රීඩා තරග පැවැත්වීමට පහසුකම් සපයනු ලැබේ. මීට අමතරව විවිධ උත්සව, සම්මේලන, සංගීත සංදර්ශන, රාජ්‍ය උත්සව හා වැඩමුළු සඳහා පහසුකම් සපයනු ලැබේ.

ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරයේ සමාරම්භක උළෙල, ජාතික ජිම්නාස්ටික් ශූරතාවලිය - 2017, ඔයලොග් ජාතික වොලිබෝල් ශූරතාවලිය - 2017 මෙම වසරේ සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනයේ ප්‍රධාන ක්‍රීඩාගාරයේදී පැවැත්විණ.

2017 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා ගෘහස්ථ ක්‍රීඩාගාරයෙන් රු. 34,939,979.00-ක ආදායමක් උපදවා ඇත.

2017 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා ගෘහස්ථ ක්‍රීඩාංගනයේ පැවැති තරඟ/ ශූරතාවලි සහ වෙනත් උත්සව පිළිබඳ සාරාංශයන් පහත පරිදි වේ.

අ.අ.	ක්‍රියාකාරකම	ජාත්‍යන්තර	ජාතික	එකතුව
01	ජිම්නාස්ටික් තරඟ	-	06	06
02	වොලි බෝල් තරඟ	-	02	02
03	බොක්ෂිං තරඟ	-	-	-
04	කරාතේ තරඟ	02	15	17
05	මේස පන්දු තරඟ	-	01	01
06	දැල් පන්දු තරඟ	-	01	01
07	සංගීත සංදර්ශන (මෙගා)	-	01	01
08	සංගීත සංදර්ශන (වෙළෙඳ නොවන)	-	01	01
09	සංගීත සංදර්ශන වෙළෙඳ	-	01	01
10	පැසි පන්දු තරඟ	-	01	01
11	වුෂු තරඟ	-	-	-
12	බැඩ් මින්ටන් තරඟ	-	02	02
13	විභාග/ අධ්‍යාපනික වැඩසටහන්	-	33	33
14	සම්මාන උළෙල	-	-	-
15	ළමා ක්‍රියාකාරකම්	-	04	04
16	සම්මේලන ,ත්‍යාග උත්සව	-	23	23
17	කාය වර්ධන තරඟ	-	-	-
18	ටයිකොන්ඩෝ තරඟ	-	01	01
19	රැස්වීම් (පිහිණුම් තටාක දේශන ශාලාව)	-	-	-
20	පුහුණුවීම්	-	27	27
21	වාණිජමය රූගත කිරීම්	-	01	01
එකතුව		**02**	**120**	**122**

උප ක්‍රීඩාගාරය

මෙම උප ක්‍රීඩාගාර බැඩ්මින්ටන් ක්‍රීඩා පිටි දෙකකින් හා ස්කොෂ් ක්‍රීඩාගාර හතරකින් සමන්විත වන අතර, ක්‍රීඩා තරඟ හා පුහුණුවීම් කටයුතු සඳහා පහසුකම් සපයයි.

පිහිණුම් තටාක සංකීර්ණය

ජාතික සහ ජාත්‍යන්තර මට්ටමේ සියලු පහසුකම් සහිත එකම පිහිණුම් තටාක සංකීර්ණය මෙම අධිකාරිය සතුව ඇති අතර, එය පහත දැක්වෙන අංගවලින් සමන්විත වේ.

1. ප්‍රධාන පිහිණුම් තටාකය

2. පුහුණුවීම් සඳහා උප පිහිණුම් තටාකය

3. කිමිදුම් තටාකය

4. ළමා පිහිණුම් තටාකය

මෙම පිහිණුම් සංකීර්ණය මඟින් පාසැල් පිහිණුම් තරඟ පැවැත්වීමේ සිට ජාත්‍යන්තර මට්ටමේ පිහිණුම් තරඟ පැවැත්වීම දක්වා අවශ්‍ය පහසුකම් සපයනු ලබන අතර, දිවා/ රාත්‍රී තරඟ සඳහා අධිබලැති විදුලි ආලෝක කුළුණු සහිත පහසුකම් සපයා ඇත. මීට අමතරව, පාසැල් ළමුන් සදහා පිහිණුම් පාසලක්ද පවත්වාගෙන යන අතර, මෙමඟින් ඉමහත් සහනදායි මුදලකට, පිහිණුම් තටාකාංගන පහසුකම් නොමැති ළමුන් සඳහා ඉතාමත් සහනදායි මුදලකට පහසුකම් සැපයීමෙන් විශාල මෙහෙයක් ඉටුකරනු ලබයි.

SLASU ජාත්‍යන්තර පිහිණුම් ශූරතාවලිය 2017

2017 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා පිහිණුම් තටාකවල පැවැති තරඟ/ ශූරතාවලි/ පුහුණුවීම් සාමාජිකත්ව පිළිබඳ සාරාංශයන් පහත පරිදි වේ.

<table>
<tr><td>පාසල් ළමුන් සඳහා පිහිණුම් සාමාජිකත්ව</td><td>662</td></tr>
<tr><td>වැඩිහිටියන් සඳහා පිහිණුම් සාමාජිකත්ව</td><td>195</td></tr>
<tr><td>පිහිණුම් තරඟ</td><td rowspan="3">30</td></tr>
<tr><td>කිමිදුම් තරඟ</td></tr>
<tr><td>ජලපන්දු තරඟ</td></tr>
<tr><td>පුහුණුවීම්</td><td>460</td></tr>
<tr><td>වෙළෙඳ රූගත කිරීම්</td><td>-</td></tr>
<tr><td>තෝරාගැනීමේ තරඟ</td><td>04</td></tr>
<tr><td>එකතුව</td><td>1351</td></tr>
</table>

ඉහත තරඟ/ ශූරතාවලි/ පුහුණුවීම් සාමාජිකත්ව සැපයීමෙන් පිහිණුම් තටාකාංගනවලින් රු.9,415,651.00ක ආදායමක් උපදවා ඇත.

ගෘහස්ථ ක්‍රීඩාංගන කායවර්ධන මධ්‍යස්ථානය

මෙම ක්‍රීඩා සංකීර්ණය ස්ථාපනය කල යුගයේ සිට පවත්වාගෙන එනු ලබන කායවර්ධන මධ්‍යස්ථානයක් පවතින අතර, එම මධ්‍යස්ථානය 2013 වසරේදී නවීකරණය කොට ඒ සඳහා නවීන කායවර්ධන උපකරණද මිලදී ගනු ලැබිණ.

මෙම මධ්‍යස්ථානය මඟින් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මෙන්ම අනෙකුත් පාර්ශවයන්ටද සාමාජිකත්වය ලබාගෙන අවශ්‍ය පහසුකම් ලබාගත හැක.

2017 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා කායවර්ධන මධ්‍යස්ථානයෙන් රු. 1,835,939.00ක ආදායමක් උපදවා ඇත.

ක්‍රීඩා හෝටලය

මෙම අධිකාරියේ සේවා පහසුකම් ලබා ගැනීම සඳහා පැමිණෙන ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙත නේවාසික පහසුකම් ලබාදීම සඳහා ස්ථාපනය කර ඇති ක්‍රීඩා හෝටලයේ මූලාරම්භක තොරතුරු හා 2016 වසරේ සිට යාවත්කාලීන තොරතුරු පහත පරිදි වේ.

මෙම ක්‍රීඩා හෝටලය සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය යටතේම පරිපාලනය කරනු ලබන අතර, මෙහි නේවාසික පහසුකම් සඳහා කාමර 42කින් යුක්ත දෙමහල් ගොඩනැගිල්ලක් ලෙස ස්ථාපනය කර ඇත. මෙහි සාමාජික සාමාජිකාවන් 150කට අධික පිරිසකට එකවර නවාතැන් ගැනීමෙහි හැකියාව ඇත. මෙහි නවාතැන් පහසුකම් ලබා ගැනීමට අමතරව උත්සව, ප්‍රියසාද පැවැත්වීම, රැස්වීම් හා වැඩමුළු පැවැත්වීම සඳහා ද පහසුකම් සලසා ඇත.

මෙම ක්‍රීඩා හෝටලය දීර්ඝ කාලයකින් නවීකරණ කටයුතු සිදුකර නොතිබුණු බැවින් 2016 වසරේ සිට අදියර වශයෙන් නවීකරණ කටයුතු සිදු කිරීම ආරම්භ කරන ලදී. ඒ අනුව, පළමු අදියර යටතේ 2016 වසරේදී මුළු මුනින්ම අබලන්ව තිබූ වහලය අලුත්වැඩියා කරන ලදී. 2017 වසරේදී දෙවන හා තෙවන අදියරයන් යටතේ නව සැලස්මකට අනුව කාමර අලුත්වැඩියා කිරීම, භෝජනාගාරයක් සැකසීම හා අලංකාරවත් මැද මිදුලක් නිර්මාණය කර ඇත. නවීකරණයෙන් පසු ක්‍රීඩා හෝටලයේ පරිහරණය සඳහා නවීනතම ගෘහ භාණ්ඩ මිළදී ගැනීමට අවශ්‍ය කටයුතු සැලසුම් කරන ලදී.

නවීකරණය වෙමින් පවතින සුගතදාස ක්‍රීඩා හෝටලය

සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනය ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය (2017 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට)

	කාර්යය	ඇස්තමේන්තු ගත වටිනාකම (රු මිලි)	2016 වසර සඳහා (රු මිලි)		2017 වසර සඳහා (රු මිලි)		භෞතික ප්‍රගතිය
			ප්‍රතිපාදන	වියදම	ප්‍රතිපාදන	වියදම	
01	සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයේ සියලුම වැසිකිළි පද්ධතිය සහ නාන කාමර අලුත්වැඩියා කිරීම	44.00	-	-	44.00	25.15	ටයිල් ඇතිරීම සහ ජල නිවාරණ කටයුතු සිදුවෙමින් පවතී.
02	ක්‍රීඩා හෝටලයේ අලුත්වැඩියා කටයුතු- අදියර 3	100.00	-	-	100.00	63.60	අවසන් අදියරයෙහි කාර්යයන්, භූමි අලංකරණය, විදුලි රැහැන් ඇදීමේ කාර්යයන් සිදුවෙමින් පවතී.
03	ප්‍රධාන ක්‍රීඩාගාරයේ පිටුපස සිවිලිම අලුත්වැඩියා කිරීම	35.00	-	-	35.00	14.79	ව්‍යාපෘති කටයුතු සිදුවෙමින් පවතී.

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ 2018 වර්ෂය සඳහා යෝජිත සංවර්ධන ව්‍යාපෘති
සුගතදස ගෘහස්ථ ක්‍රීඩාංගණය

	කාර්යය	අයවැය ප්‍රතිපාදන 2018 (රු මිලි)
01	ප්‍රධාන ක්‍රීඩාගාරයේ ශබ්ද වාහිනි පද්ධතිය ස්ථාපනය කිරිම	210.00
02	ප්‍රධාන ක්‍රීඩාගාරයේ ආලෝක පද්ධතිය ස්ථාපනය කිරීම	200.00
03	ප්‍රධාන ක්‍රීඩාගාරයේ වායු සමීකරණ පද්ධතිය අලුත්වැඩියා කිරීම	75.00
04	ප්‍රධාන ක්‍රීඩාගාරයේ සියලු අලුත්වැඩියාවන් (වැසිකිළි පින්තාරු කිරීම, කාණු පද්ධතිය, වෛද්‍ය කාමරය සහ පිහිණුම් තටාකය සඳහා ස්ථිර දැලක් යෙදීම)	100.00
05	නව ආපනශාලාවක් ඉදිකිරීම	20.00
06	ප්‍රධාන ක්‍රීඩාගාරයේ සඳහා වේදිකාවක් ඉදිකිරීම (32'x40')	50.00
07	උප ක්‍රීඩාගාරයේ අලුත්වැඩියා කටයුතු	10.00

සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනය

දිවා සහ රාත්‍රි කාලවලදී ජවන හා පිටිය ක්‍රීඩා තරඟ පැවැත්වීමට හැකි ආකාරයට මෙම ක්‍රීඩාංගනය සකසා ඇත. මෙම ක්‍රීඩාංගනයේ එකවර ප්‍රේක්ෂකයින් 20,000 කට පමණ තරඟ නැරඹිය හැකි ආකාරයට ක්‍රීඩාගාර පහසුකම් සපයා ඇත.

එළිමහන් ක්‍රීඩාංගනයේ මීටර් 400 හා මීටර් 200 වශයෙන් කෘත්‍රිම ධාවන පථ 02ක් ඇත. මීට අමතරව මහල් තුනකින් යුත් මාධ්‍ය කුටියක්, අධිබලැති විදුලි ආලෝක පද්ධතියක් මඟින් රාත්‍රි ක්‍රීඩා තරඟ පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සපයා ඇත. මෙම ක්‍රීඩා පිටියේ මළල ක්‍රීඩා, වොලිබෝල්, රගර්, පාපන්දු, පැසිපන්දු ක්‍රීඩා මෙන්ම විවිධ උත්සව සඳහාද පහසුකම් සපයනු ලැබේ.

2017 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා මෙම ක්‍රීඩාංගනයේ පැවැත්වූ තරඟ හා උත්සව පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

අ.අ.	ක්‍රියාකාරකම	ජාතික	ජාත්‍යන්තර	එකතුව
01	පාපන්දු තරඟ	-	-	-
03	ක්‍රීඩා උත්සව (පාසල් නිවාසාන්තර තරඟ)	-	-	-
04	ක්‍රීඩා උත්සව (මීටර් 200 ධාවන පථය)	39	-	39
05	මළල ක්‍රීඩා තරඟ	-	-	-
06	රගර් තරඟ	09	-	09
07	පුහුණුවීම්	122	-	122
08	ව්‍යායාම සඳහා ඇවිදීමේ සාමාජිකත්ව	82	-	82
09	දැල් පන්දු තරඟ	19	-	19
10	වෙනත්	03	-	03
එකතුව		**274**	**-**	**274**



2017 වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනයේ පැවැත්වූ තරඟ, උත්සව, ඩී රථගාල, බදු කුළී හා වෙනත් ප්‍රභවයන් මගින් රු. රු.17,158,110.63ක ක ආදායමක් උපදවා ඇත.

සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනය ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය (2017 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට)

(2017-12-31 දිනට)

	කාර්යය	ඇස්තමේන්තුගත වටිනාකම (රු මිලි)	2016 වසර සඳහා (රු මිලි)		2017 වසර සඳහා (රු මිලි)		භෞතික ප්‍රගතිය
			ප්‍රතිපාදන	වියදම	ප්‍රතිපාදන	වියදම	
01	සුගතදාස එළිමහන් ක්‍රිඩාංගණයේ පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම -අදියර 3 (බී)	31.00	-	-	31.00	25.93	අවසන් අදියරයෙහි ව්‍යාපෘති කාර්යයන් සහ කාර්යාල වෙන්කිරීම් කාර්යයන් සිදුවෙමින් පවතී.
02	සුලු සේවකයින් සඳහා නේවාසික ගොඩනැගිල්ල ඉදිකිරීම - අදියර 1	57.00	-	-	57.00	26.73	විශේෂ ව්‍යුහමය කාර්යයන් සිදුවෙමින් පවතී.
03	මීටර් 200 හා මීටර් 400 කෘතිම ධාවන පථය නැවත ඇතිරීම		500.00	0.14	300.00	56.32	මීටර් 200 කෘතිම ධාවන පථයෙහි ඇස්පෝල්ට් ඇතිරීම.
04	සභාපති බංගලාවෙහි අලුත්වැඩියා කටයුතු- අදියර 1	10.00	-	-	10.00	8.22	පළමු අදියර සම්පූර්ණ කර ඇත.

සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනයේ 2018 වර්ෂය සඳහා යෝජිත සංවර්ධන ව්‍යාපෘති

අ.අ	කාර්යය	අයවැය ප්‍රතිපාදන (රු.මිලි)
01	මීටර් 400 කෘතිම ධාවන පථයෙහි ඉදිරි වැඩ	75.00
02	මීටර් 200 කෘතිම ධාවන පථයෙහි ඉදිරි වැඩ	50.00
03	පතිත ධාරා ආලෝක පද්ධතියේ අලුත්වැඩියාවන් සහ වැඩිදියුණු කිරීම්	220.00
04	සූර්යබල පද්ධතිය ස්ථාපනය කිරීම	225.00

05	කාලඝණක පද්ධති (පිහිනුම්, ධාවන පථ, පිටිය)	300.00
06	ප්‍රේක්ෂකාගාරය නැවත ඉදිකිරීම	1200.00
07	මායිම් තාප්පය සහ යකඩ ගේට්ටුව අලුත්වැඩියා කිරීම (ගෘහස්ථ/එළිමහන්)	150.00
08	ඕ රථගාලෙහි අලුත්වැඩියාවන්	50.00
09	මාර්ග පද්ධතිය අලුත්වැඩියා කිරීම	50.00
10	ධාරිත්‍රක බැංකුව ස්ථාපනය කිරීම	25.00
11	ක්‍රීඩා උපකරණ මිලදී ගැනීම	30.00
12	ආලෝක පද්ධතිය ප්‍රතිස්ථාපනය කිරීම (ගෘහස්ථ හා එළිමහන්) (LED)	25.00
13	ස්කොෂ් පිටිය, පැසිපන්දු පිටිය, දැල්පන්දු පිටිය අලුත්වැඩියා කිරීම	25.00
14	අපවහන ජලය ගලා බසින ඇල මාර්ග පද්ධතිය අලුත්වැඩියා කිරීම	20.00
15	භූමි අලංකරණය (ගෘහස්ථ/එළිමහන්)	25.00
16	මහජන ඇමැතුම් පද්ධතිය (මීටර් 400 හා මීටර් 200)	15.00

ආර්.ප්‍රේමදාස ක්‍රිකට් ක්‍රීඩාංගනය

ආර්.ප්‍රේමදාස ක්‍රිකට් ක්‍රීඩාංගනය අප රට සතු ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ ක්‍රිකට් තරඟ පැවැත්වීමට අවැසි සියලු පහසුකම්වලින් සමන්විත එක් ක්‍රීඩාංගනයකි. මෙහි එකවර ප්‍රේක්ෂකයින් 35,000කට පමණ තරඟ නැරැඹීමේ පහසුකම් ඇති අතර, විශාල රථ ගාලකින්ද යුක්ත වේ. මෙම ක්‍රීඩාංගනය 2006-05-10 දින ගනු ලැබූ කැබිනට් මණ්ඩල තීරණයක් අනුව 2006-11-01 දින සිට වසර තිහක කාලයක් සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට මසකට රු. 250,000/- ක මුදලකට බදු දී ඇත. ඒ අනුව, 2017 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා මෙම ක්‍රීඩාංගනය මගින් රු. 3,000,000.00ක ආදායමක් උපදවා ඇත.

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ ප්‍රධානතම ආදායම් මාර්ගයක්ව පැවැති මෙම ක්‍රීඩාංගනය දීර්ඝ කාලීනව මාසික නොවෙනස් බදු කුලියක් සහිතව බදුදීම මෙම අධිකාරියේ ආදායම පහත වැටීමට බලපා ඇත.

බෝගම්බර එළිමහන් ක්‍රීඩාංගනය

මෙම ක්‍රීඩාංගනය මහනුවර නගර සභාව විසින් පාලනය කරන ලද අතර, 1999 සිට අප අධිකාරිය මඟින් පාලනය කරනු ලැබේ. මෙම එළිමහන් ක්‍රීඩාංගනය තුළ එකවර ප්‍රේක්ෂකයින් 10,000කට පමණ තරග නැරැඹිය හැකි ආකාරයේ ක්‍රීඩාගාර පහසුකම් ඇත. මෙහි මළල ක්‍රීඩා, පාපන්දු, රගර්, වොලිබෝල්, දැල්පන්දු, පාසැල් ක්‍රීඩා උත්සව හා වෙනත් උත්සව සඳහා පහසුකම් ඇත.

මෙම ක්‍රීඩාංගනය සඳහා නව කායවර්ධන මධ්‍යස්ථානයක් ඉදි කර ඒ සඳහා නවීන කායවර්ධන උපකරණද මිදී ගනු ලැබූ අතර ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මෙන්ම වෙනත් පාර්ශවයන්හටද මෙහි සාමාජිකත්වය ලබාගෙන අවශ්‍ය පහසුකම් ලබාගත හැක.

ප්‍රසිද්ධ සංගීත සංදර්ශන ආදියට එළිමහන් රටගාල භාවිත කිරීම සඳහා ඉඩකඩ ලබා දුනහොත් ආදායම ඉහළ නැංවිය හැකි වුවත් ක්‍රීඩාංගනයේ තිබෙන ක්‍රීඩා පහසුකම්වලට හානි සිදුවිය හැකි බැවින් එසේ සිදු කරනු නොලැබේ.

2017 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා මෙම ක්‍රීඩාංගනයේ පැවැත්වූ තරඟ/ශූරතාවලි හා උත්සව පිළිබඳ සාරාංශය පහත පරිදි වේ.

පාසල් මළල ක්‍රීඩා	- 40
මළල ක්‍රීඩා	- 19
පාපන්දු තරඟ	- 19
රගර් තරඟ	- 12
හොකී තරඟ	- 02
වෙනත්	- 05

2017 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා මෙම ක්‍රීඩාංගනයේ පැවැත් වූ ක්‍රීඩා තරඟ හා උත්සව, රට ගාලෙන්, කායවර්ධන මධ්‍යස්ථානය මඟින් හා වෙනත් ලැබීම් වලින් රු.8,411,674.92 ක ආදායමක් උපදවා ඇත.

බෙලිඅත්ත හා වීරකැටිය පිහිණුම් තටාක

බෙලිඅත්ත කිමිදුම් තටාකය

බෙලිඅත්ත ප්‍රධාන පිහිණුම් තටාකය

මෙම පිහිණුම් තටාක පහත අංගවලින් සමන්විත වේ.

වීරකැටිය පිහිණුම් තටාකය

බෙලිඅත්ත

1. මංතීරු 08ක් සහිත මීටර් 50ක් දිගැති පිහිණුම් තටාකය
11. කිමිදුම් තටාකය

වීරකැටිය

1. මංතීරු 08ක් සහිත මීටර් 25ක් දිගැති පිහිණුම් තටාකය

බෙලිඅත්ත කාර්මික විදුහලේ හා වීරකැටිය රාජපක්ෂ මධ්‍ය මහා විද්‍යාලයේ පිහිණුම් තටාකවල පරිපාලනය හා නඩත්තු කටයුතු පමණක් 2008-08-07 දින සිට සුගතදාස අධිකාරිය විසින් සිදු කරනු ලැබුවත් මෙම පිහිණුම් තටාකවල අයිතිය සුගතදාස අධිකාරිය සතු නොවේ. අවට ප්‍රදේශවල වැඩිහිටියන් හා පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් හට පිහිණුම් කටයුතු සඳහා පහසුකම් සැපයීම සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය විසින් සිදු කරනු ලබයි.

මෙම පිහිණුම් තටාකවල 2017 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා මුළු ආදායම **රු.723,753.00ක්** වේ. මෙම පිහිණුම් තටාක දෙක පිළිබඳව වැඩිහිටියන්, පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සහ ක්‍රීඩා සමාජ දැනුවත් කළද සහභාගිත්වය ඉතාමත් අඩු බැවින් ඉහළ ආදායමක් අපේක්ෂා කළ නොහැක.

තවද, වීරකැටිය පිහිනුම් තටාකය පිහිටා ඇත්තේ වීරකැටිය මධ්‍ය විද්‍යාල භූමිය තුළය. ඒ අනුව, පිහිණුම් තටාකයට ප්‍රවේශයද විදුහලේ ප්‍රධාන දොරටුවෙන් සිදුවන බැවින්, පිහිණුම් තටාකය ඌන උපයෝජනයකට පත්ව ඇත. මෙම පිහිණුම් තටාකවල නඩත්තු කටයුතු සඳහා දරන වියදමට සාපේක්ෂව ආදායමක් නොලබන බවද සඳහන් කළ යුතුය.

නුවරඑළිය තුරඟ තරඟ පිටිය

2011-09-07 දින ක්‍රීඩා අමාත්‍යාංශය විසින් නුවරඑළිය තුරඟ තරඟ පිටියේ කළමනාකාරීත්වය සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියට පවරන ලදී.

භූමි ප්‍රමාණය හෙක්ටයාර 34,564ක් වූ මෙම තුරඟ තරඟ පිටියෙන් 2017 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා අශ්ව ගාල්වලින්, බදුකුළී, අශ්ව/ පෝනි ඇවිදීම වෙනුවෙන් ලද ආදායම හා 2017 වසන්ත සැණකෙළිය සඳහා භූමිය කුළී පදනම මත ලබා දීම හා රථ වාහන නවතා තැබීමෙන් ලද ආදායම ලෙස රු.4,013,016.41ක් උපයා ගෙන ඇත.

අමාත්‍ය මණ්ඩල සංදේශ හා ගනු ලැබූ පියවර

1. සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරී පනත සංශෝධනය කර 2017 අංක 14 දරන සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරී අධිකාරී සංශෝධන පනත ලෙස 2017.08.18 දින පාර්ලිමේන්තු ගැසට් පත්‍රයේ 11 වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකර ඇත.

2017 අංක 14 දරන සුගතදාස අධිකාරී පනත සංශෝධනයෙන් පසු ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියට ඉක්බිතිව එකතු කරන ලද අලුත් වගන්තිය ඇතුළත් කර ඇති අතර, 2 (අ) වගන්තිය ලෙස බලාත්මක කිරීමට අධිකාරියේ අරමුණු සකසා ඇත.

2017 වසරේ එළිමහන් ක්‍රීඩාංගනයේ මීටර් 200 හා මීටර් 400 කෘත්‍රිම ධාවන පථ නැවත ඇතිරීම තුළින් ක්‍රීඩා පහසුකම් ලබාදීම වැඩිදියුණු කිරීමටත්, ගෘහස්ථ ක්‍රීඩාංගනයේ ඇති ක්‍රීඩා හෝටලය නවීකරණය කර ක්‍රීඩකයන්ට නවාතැන් පහසුකම් ලබාදීම මෙන්ම, සලසා ඇති පහසුකම් යටතේ අවශ්‍යතාවය පරිදි බාහිර පාර්ශවයන්ට නවාතැන් ලබා ගැනීමේ පහසුකම් සැලසී ඇත. ගෘහස්ථ ක්‍රීඩාංගනයේ පහසුකම් තුළත් වාර්ෂිකව පැවැත්වෙන අධ්‍යාපනික, සංස්කෘතික හා විනෝදාත්මක කටයුතු සඳහා වෙන් කිරීම්ද සිදුකර ඇත.

එමෙන්ම අමාත්‍යවරයා විසින් කළමනාකාරීත්ව මණ්ඩලයේ එක් සාමාජිකයෙකු අධිකාරියේ කටයුතු කළමනාකරණය කිරීම හා පරිපාලනය කිරීම පහසු කිරීම පිණිස අධිකාරියේ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කිරීමට පත්කර අධිකාරියේ පරිපාලන කාර්යයන් අඛණ්ඩව සිදුකිරීම.

2. නුවරඑළිය තුරඟ තරඟ ක්‍රීඩාංගනය වසර 10ක දීර්ඝ කාලීන බදු පදනම මත ලබා දීම සම්බන්ධ සංදේශය.

නුවරඑළිය තුරඟ තරඟ ක්‍රීඩාංගනය වසර 10ක දීර්ඝ කාලීන බදු පදනම මත ලබා දීම සඳහා අමාත්‍ය මණ්ඩලයෙන් ලබා දුන් අනුමැතියට අනුව, ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුව බදු ගැනුම්කරුවෙකු තෝරා ගන්නා ලදී.

ආයතනයේ සමස්ථ ප්‍රගතිය

2008 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ආයතනය විසින් උපයා ඇති ආදායම් පහත පරිදි විචලනය වී ඇත.

වර්ෂය	2008	2009	2010	2011	2012	2013	2014	2015	2016	2017
ආදායම්	54.78	57.85	61.60	69.00	77.17	89.03	134.61	99.62	82.51	100.29



ආයතනයේ මූළු ණය

2008 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා තිබූ ණය තත්ත්වය පහත ආකාරයට විචලනය වී ඇත.

වර්ෂය	2008	2009	2010	2011	2012	2013	2014	2015	2016	2017
ණය	2.30	4.61	133.03	42.95	42.04	41.00	45.00	44.00	43.70	40.254



සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

ගිණුම්කරණ ප්‍රතිපත්ති
2017

01. සාමාන්‍ය

1.1 **අනුකූලවීමේ ප්‍රකාශය**

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ ගිණුම් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇත.

1.2 **පිළියෙල කිරීමේ පදනම**

මූලය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර ඉඩම් ගොඩනැගිලි සහ යන්ත්‍ර සූත්‍ර ප්‍රත්‍යාගණනය සඳහා වූ ගැලපිලි කිරීම්වල දක්වා ඇත. මෙහිදී උද්ධමන තත්ත්වයන් සැලකිල්ලට ගෙන නොමැත.

1.3 **ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම**

ශේෂ පත්‍ර දිනට පසුව සිදුවන සියලුම ප්‍රමාණාත්මක බලපෑම් තිබේනම් ඒ සඳහා මූල්‍ය වාර්තාවල අවශ්‍ය ගැලපීම් සිදුකර ඇති අතර එම ගැලපීම් ගිණුම්වල හෙළිදරව් කර ඇත.

02. වත්කම් සහ ඒවා අගය කිරීමේ පදනම

ශේෂපත්‍රයෙහි පෙන්නුම් කරන වත්කම්වලින් ජංගම වත්කම් ලෙස හඳුනාගෙන ඇත්තේ මුදල් සහ බැංකු ශේෂයන් සහ සාමාන්‍ය ගණුදෙනු ක්‍රියාවලිය තුලදී වසරක් තුල මුදල් බවට පරිවර්තනය විය හැකි යැයි සැලකෙන අයිතම වේ.

2.1 වත්කම්

දේපල , පිරියත හා යන්ත්‍ර උපකරණ යන වත්කම්වල අගය පෙන්වා ඇත්තේ සමුච්චිත ක්ෂය අඩුකල පසු අගයටය.

ගොඩනැගිලි වත්කම්වල අඩංගු වන පිරිවැය වන්නේ ද්‍රව්‍ය හා සෘජු ශ්‍රම පිරිවැයයි. එසේම ස්ථාවර වත්කම් ප්‍රධාන උප අංගවලට වෙන්කර ඇත්තේ ඒවායේ ප්‍රයෝජනයට ගනු ලැබූ කාලය සලකා බලාය.

<u>ආර් ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය</u>

ආර් ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය 2006-11-01 දින සිට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් මසකට රු. 250,000/- අයකිරීම් පදනම මත වසර 30ක කාලයකට බදු පදනම යටතේ ලබාදී ඇත. 2006-12-31 වන දින වනවිට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය මගින් ඉදිකරන ලද ගොඩනැගිල්ල සඳහා සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියට රු.25,753,844.64 මුදලක් අයවිය යුතුව තිබෙන අතර ඒ පිළිබඳව හා වර්තමානයේ අයකරනු ලබන මාසික කුලිය පිළිබඳව දෙපාර්ශවය අතර එකඟතාවයට පැමිණීමට බලාපොරොත්තු වේ.

<u>බෙලිඅත්ත හා වීරකැටිය පිහිනුම් තටාක සංකීර්ණය</u>

බෙලිඅත්ත කාර්මික විද්‍යාලේ හා වීරකැටිය රාජපක්ෂ මධ්‍ය මහා විද්‍යාලයට අයත්ව තිබූ පිහිනුම් තටාක දෙක සහ කිමිදුම් තටාකය 2008 වසරේ අගෝස්තු 07 දින සිට සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය විසින් නඩත්තු කටයුතු සිදුකරනු ලබයි. අධිකාරියේ කළමනාකාරණ අනුමැතිය මත සේවකයින් දස (10) දෙනෙක් තාවකාලික පදනම මත අනුයුක්ත කර ඇත.

2008 වසරේ මෙම පිහිනුම් තටාකවල වියදම් ගෘහස්ථ ක්‍රීඩාංගණයේ වියදම් ලෙෂ ගිණුම් ගත කලද කළමනාකරණ මණ්ඩල තිරන මත 2009 වසරේ සිට මෙම පිහිනුම් තටාකවල වියදම් වෙනම ගිණුම්වල දැක්වේ.

2.2 අනෙකුත් වියදම්

දේපල පිරියත හා උපකරණ තුල අඩංගු කොටස් නැවත ස්ථාපිත කිරීම සඳහා දරණ ලද වියදම් වෙනම ගිණුම්ගත කර ඇති අතර ඒවා ප්‍රාග්ධනික කර ප්‍රයෝජනවත් ආයුකාලය තුල ලියාහැරීම සඳහා ගිණුම්ගත කර ඇත. අනෙකුත් වියදම් ප්‍රාග්ධනීත කර ඇත්තේ එම වියදම් මගින් වත්කම්වල අනාගත ආර්ථික ප්‍රතිලාබවල වර්ධනයක් සිදුවන වියදම් වන අතර අනෙකුත් සියලුම වියදම් ආදායම් ප්‍රකාශනයට ගලපා ඇත.

2.3 ක්ෂයවීම්

ක්ෂය ප්‍රතිපත්තිය ලෙස සරල මාර්ග ක්‍රමය අනුගමනය කරනු ලබන අතර වත්කම්වල ක්ෂයවීම් සිදුකරන්නේ වත්කම් මිලදී ගත් වර්ෂයේ හෝ ඉදිකිරීම් සම්පූර්න කල වසරේ සිටය. ක්ෂය අපේක්ෂිත ආයුකාලය තුල ආදායම් වියදම් ගිණුමට ලියා හැර ඇත. ඉඩම් සඳහා ක්ෂයවීම් සිදුකර නොමැත.

➢ ගොඩනැගිලි සහ ඉදිකිරීම්	2.5%
➢ අධිබලැති විදුලි කුලුණු	10%
➢ කෘතිම ධාවන පථය	20%
➢ යන්ත්‍ර හා උපකරණ	10%
➢ පරිගණක	25%
➢ මෝටර් රථ	20%
➢ ක්‍රීඩා උපකරණ	10%
➢ ලී බඩු හා උපකරණ	10%
➢ කාර්යාලිය උපකරණ	10%
➢ තිරරෙදි	50%
➢ අධිබලැති විදුලි බල්බ සහ පිවලකය (ඉග්නයිටර්)	33 1/3%

32-5811 දරණ පැජරෝ රථය මිනිස්බල හා යෙදවුම් අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කර ඇති හෙයින් අප අධිකාරියේ වත්කමක් ලෙස සැලකිය නොහැක. ඊට අදාල නඩත්තු හා අනෙකුත් වියදම් අධිකාරියේ ආදායම් වියදම් ප්‍රකාශයේ දක්වා ඇත.

64-3180 දරණ පැජරෝ රථය ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කර ඇති හෙයින් අප අධිකාරියේ වත්කමක් ලෙස සැලකිය නොහැක. ඊට අදාල නඩත්තු හා අනෙකුත් වියදම් අධිකාරියේ ආදායම් වියදම් ප්‍රකාහයේ දක්වා ඇත.

ජාතික අයවැය චක්‍රලේඛ 150ට අනුව මහා භාණ්ඩාගාරයෙන් රු.9,100,000ක් වටිනා NB-1527 අංක දරන නව වෑන් රථය ලබාදී ඇත. එම වාහනයේ වටිනාකම ලෙස රක්ෂිත වටිනාකම ගිණුම්ගත කර ඇත.

ජාතික අයවැය චක්‍රලේඛ 150ට අනුව මහා භාණ්ඩාගාරයෙන් රු.7,500,000ක් වටිනා PD-9713 අංක දරන නව කැබ් රථය ලබාදී ඇත. එම වාහනයේ වටිනාකම ලෙස රක්ෂිත වටිනාකම ගිණුම්ගත කර ඇත.

ජාතික අයවැය චක්‍රලේඛ 150ට අනුව මහා භාණ්ඩාගාරයෙන් රු.210,267.86ක් වටිනා BBG-3006 අංක දරන නව යතුරු පැදිය ලබාදී ඇත. එම යතුරු පැදියේ වටිනාකම ලෙස රක්ෂිත වටිනාකම ගිණුම්ගත කර ඇත.

2.4 වෙළඳ හා අනෙකුත් ණය ගැනීම්

වෙළඳ හා අනෙකුත් ණය ගැනීම් මූල්‍ය ප්‍රකාශවල දක්වා ඇත්තේ ඒවායේ ශුද්ධ උපලබ්දිත අගය මතය.

2.5 තොග

තොග මූල්‍ය වාර්තාවල දක්වා ඇත්තේ පිරිවැයටය. තොග වටිනාකම්වල ප්‍රථම ලැබුම්, ප්‍රථම නිකුතු ක්‍රමය මත තිරණය කරන අතර එයට මිලදී ගැනුම් පිරිවැය හා තොග වර්තමාන තත්ත්වය හා අදාල ස්ථානයට ගෙනෙන තෙක් දරණ සියලුම වියදම්වලට අදාල වේ.

03. වෙන්කිරීම් හා වගකීම්

මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේදී හඳුනා ගන්නා ලද සියලුම වගකීම් ගිණුම්ගත කර ඇත. මූල්‍ය වාර්තාවල ජංගම වගකීම් ලෙස හඳුනාගෙන ඇත්තේ ශේෂපත්‍ර දින සිට වසරක් තුල ගෙවා නිමකල යුතු හෝ ඉල්ලුවිට ගෙවිය යුතු වගකීම් වේ. ජංගම නොවන වගකීම් යනු වසරකට වඩා වැඩි කාලයක් තුලදී ගෙවා නිමකල යුතු වගකීම් ය.

3.1 සේවක හිමිකම්

සේවක අර්ථසාදක අරමුදල හා සේවක භාරකාර අරමුදල කරන ලද දායකත්වයන් මූල්‍ය වාර්තාවල වියදම් ලෙස හඳුනාගෙන ඇත.

3.2 වෙළඳ හා අනෙකුත් ගෙවීම්

වෙළඳ හා අනෙකුත් ගෙවීම් ඒවායෙහි පිරිවැය මත මූල්‍ය වාර්තාවල දක්වා ඇත.

3.3 සේවක විශ්‍රාම පාරිතෝෂික

පාරිතෝෂික සඳහා මූල්‍ය වාර්තාවල වෙන්කිරීම් සිදුකර ඇති අතර ප්‍රථම සේවා වර්ෂයේ සිටම සෑම සේවකයෙක්ම මෙම වෙන්කිරීම් සඳහා සලකා ඇත. මෙය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16ට අනුකූල වන ලෙස සිදුකර ඇත. කෙසේ වෙතත් මෙම ගෙවීම් සිදුකරනු ලබන්නේ 1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීම් පනත අනුව හිමිකම් ලබා අඛණ්ඩ වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කල සේවකයන්ට පමණි.

04. ආදායම් ප්‍රකාශය

4.1 ආදායම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 29 අනුව අදාල සේවාවන් සැපයීමෙන් පසු උපචිත පදනම මත ආදායම් හඳුනාගෙන ඇත.

4.2 වියදම්

ආදායම් විස්තරයේ ලාභය හෝ අලාභය හඳුනාගෙන ඇත්තේ බදුවලට පෙර හා සියලුම හඳුනාගත් වගකීම් සඳහා වෙන්කිරීම් කිරීමෙන් පසුය.

ශුද්ධ හිඟය ගණනය කිරීමේදී වත්කම් නඩත්තු කිරීමේ සහ ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා දරණ ලද වියදම් ආදායම් විස්තරයට ගලපා ඇත.

ආයතනයේ පහසුකම් ලබාදී ඇති නිලධාරීන් සහ සේවකයිනීගෙන් දුරකථන, විදුලි, ජල බිල්පත් සහ කුලී අයකරනු ලබන අතර අදාල වියදම් තිරු තුල පෙන්වා ඇත.

මූල්‍ය වියදම්

ස්ථාවර තැන්පතුවල පොලී ආදායම උපචිත ක්‍රමයට ගිණුම්ගත කර ඇත. පොලී වියදම් සහ අනෙකුත් ණය වියදම්, මූල්‍යය වියදම් ගණනය කිරීමේදී ගලපා ඇත.

දීමනා

ප්‍රදාන හා ආධාර ඊට අදාල වියදම්වලට සරිලන පරිදි ගලපා ඇත. වත්කම්වලට අදාල මූල්‍යමය නොවන ප්‍රදාන එහි මූල්‍ය වටිනාකමට ගිණුම්ගත කර ඇති අතර එම වත්කම් ප්‍රයෝජනවත් ආයුකාලය තුලදී ආදායම් ප්‍රකාශයට ලියාහරිනු ලැබේ.

05. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

5.1 මුදල්

මුදල් යනුවෙන් හඳුන්වා ඇත්තේ අත ඉතිරි මුදල් සහ ඉතා ඉහල ද්‍රව ශීලතාවයක් සහිතව මුදල් බවට පරිවර්තනය කළහැකි එසේ පරිවර්තනය කිරීමේදී කිසිදු අවධානමක් රහිත වත්කම් වේ. මේ සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් යනු, ඇතැති මුදල් හා බැංකු මුදල් වේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකසා ඇත්තේ වක්‍ර ක්‍රමය පදනම් කරගෙනය.

06. ශේෂපත්‍ර දිනට පසු සිදුවීම්

ශේෂපත්‍ර දිනට පසු වූ ප්‍රමාණාත්මක සිදුවීම් සියල්ල සැලකිල්ලට ගෙන ඇති අතර අවශ්‍ය ගැලපීම් ගිණුම් මගින් හෙලිදරව් කර ඇත.

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

1. ආදායම් වියදම් ප්‍රකාශය
2. ශේෂ පත්‍රය
3. අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය

ආදායම් වියදම් ප්‍රකාශය

2017 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ප්‍රකාශය

	2017.12.31 (රුපියල්)	2016.12.31 (රුපියල්)
ආදායම	100,299,300	82,516,046
රජයේ භාණ්ඩාගාර ප්‍රතිපාදන	120,560,000	160,800,000
මුළු ආදායම	**220,859,300**	**243,316,046**
වියදම්		
මෙහෙයුම් වියදම්		
සේවක වේතන වියදම්	185,366,888	178,806,207
කළමනාකාරීත්ව මණ්ඩලයේ දීමනා හා වියදම්	513,621	799,500
පාරිතෝෂික වෙන්කිරීම්	5,324,908	22,539,050
ක්ෂයවීම්	94,524,071	89,648,834
අනෙකුත් වියදම්	96,979,319	71,551,859
මෙහෙයුම් අතිරික්තය (හිගය)	**(161,849,507)**	**(120,029,404)**
අතිරික්ත පාරිතෝෂික වෙන්කිරීම්	-	-
මූල්‍ය වියදම්	(246,770)	(216,844)
බදු පෙර අතිරික්තය (හිගය)	**(162,096,277)**	**(120,246,248)**
එකතුකළ : මෙහෙයුම් නොවන ආදායම්		
ස්ථාවර තැන්පතු පොලි ආදායම	7,907,177	3,150,909
පෙර බදු ශුද්ධ අතිරික්තය (හිගය)	**(154,189,100)**	**(117,095,339)**
ආදායම් බදු	(770,950)	**(307,214)**
වර්ෂයේ අතිරීක්තය (හිගය)	**(154,960,050)**	**(117,402,554)**

ශේෂ පත්‍රය - 2017 දෙසැම්බර් 31 වන දිනට ශේෂ පත්‍රය

වත්කම්	2017.12.31 (රුපියල්)	2016.12.31 (රුපියල්)
ජංගම වත්කම්		
මුදල් හා බැංකු ශේෂය	(3,567,111)	76,663,031
ණය ගැතියෝ	12,876,630	10,811,023
තොගය	10.985,193	11,483,637
කාර්ය මණ්ඩලයේ දස මාසික ණය ලබාදීම්	24,127,690	21,507,043
අත්තිකාරම් සහ අනෙකුත් ලැබිය යුතු ශේෂ	143,111,309	104,938,717
	187,533,711	**225,403,451**
ස්ථාවර වත්කම්		
ඉඩම්	2,856,612,140	2,856,612,140
ගොඩනැගිලි	1,207,974,723	1,243,588,617
අධිබලැති විදුලි කුළුණු	1.372,978	1,372,978
අධිබලැති විදුලි බල්බ	1,266,922	1,266,922
යන්ත්‍ර සහ උපකරණ	113,862,746	93,062,982
පරිගණක	7,033,758	3,517,471
මෝටර් රථ	230,068	376,222
ක්‍රීඩා උපකරණ	35,279,079	27,459,563
ලී බඩු සහ උපකරණ	15,584,202	17,832,243
කාර්යාලීය සහ අනෙකුත් උපකරණ	7,085,560	8,023,582
තිර රෙදි	-	616,564
සිදු කෙරෙමින් පවතින වැඩ	668,713,029	297,146,860
ස්ථාවර තැන්පත් හා පාරිතෝෂික අරමුදල	33,135,557	32,924,319
සමස්ථ වත්කම්		
ප්‍රාග්ධන ස්කන්ධය සහ වගකීම් - ජංගම වගකීම්		
වෙළෙඳ ණය හිමියෝ	26,419,723	7,532,472
ආරක්ෂිත තැන්පතු	10,407,436	9,115,537
කලින් ලද ආදායම්	329,439	2,869,115
ආදායම සඳහා ලද අත්තිකාරම්	-	500,000
බදු වෙන්කිරීම්	1.563,190	792,240
උපචිත වියදම් හා අනෙකුත් ගෙවිය යුතු වියදම්	17,166,270	13,173,499
අනෙකුත් ගෙවිය යුතු දෑ	86,169,233	70,181,833
		104,164,696
ජංගම නොවන වගකීම්		
පාරිතෝෂික දීමනා	67,654,232	65,369,896
		65,369,896
සමස්ථ වගකීම්	**209,709,523**	**169,534,593**
ශුද්ධ වත්කම්	**4,925,974.885**	**4,639,669,328**
ශුද්ධ වත්කම්/ ප්‍රාග්ධන ස්කන්ධ		
රජයේ ප්‍රදාන	6,597,462,609	6,160,621,609
සමුච්චිත අරමුදල	(1,525,862,328)	(1,412,884,380)
ප්‍රත්‍යාගණන අතිරික්තය	9,334,652	9,334,652
වර්ෂයේ අතිරික්තය/ ඌනතාවය	(154,960,050)	(117,402,554)
මුළු ප්‍රාග්ධන ස්කන්ධ සහ වගකීම්	**4,925,974,885**	**4,639,669,328**

අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය

2017 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2017.12.31 (රුපියල්)	2016.12.31 (රුපියල්)
මෙහෙයුම්වලින් ලද මුදල් ප්‍රවාහය		
බදු පෙර අතිරික්තය හෝ ශුද්ධ ඌනතාවය	**(154,960,050)**	**(117,402,554)**
සමුච්චිත අරමුදලට පසුගිය වසරවල කරන ලද ක්ෂය ගැලැපීම්		
ක්ෂය ගැලපීම්	94,524,071	89,648,834
පාරිතෝෂික වෙන්කිරීම්	5,324,908	22,539,050
(වැඩිවීම්) / අඩුවීම් තොග	498,445	4,103,390
(වැඩිවීම්) / අඩුවීම් ලැබිය යුතු ශේෂය	(42,976,891)	(14,780,867)
(වැඩිවීම්) / අඩුවීම් ගෙවිය යුතු ශේෂය	37,890,595	18,814,526
පාරිතෝෂික දීමනා ගෙවීම්	(3,040,572)	(1,384,325)
මෙහෙයුම්වලින් ලද ශුද්ධ මුදල් ශේෂය	**(62,739,495)**	**(6,668,726)**
ආයෝජන කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහය		
දේපළ, පිරියත සහ යන්ත්‍ර උපකරණ මිලදී ගැනිම	(458,663,060)	(224,303,395)
බදු ගෙවීම		
ස්ථාවර තැන්පතුවල ආයෝජනය	(93,193)	
REPO ආයෝජන	-	180,000,000
ආයෝජන කටයුතුවලින් ලද මුදල් ශේෂය	**(458,756,253)**	**(63,303,396)**
මූල්‍ය කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහය		
සමුච්චිත අරමුදලෙහි වෙනස්වීම්	4,424,606	92,718
රජයේ ප්‍රාග්ධන ප්‍රදාන	436,841,000	175,250,000
මූල්‍ය කටයුතුවලින් ලද මුදල් ශේෂය	**441,265,606**	**175,342,717**
මුදල් හා මුදල් සමාන දෑ වලින් ශුද්ධ වැඩිවීම්	(80,230,142)	105,370,596
වර්ෂ ආරම්භයේදී මුදල් හා මුදල්වලට ආසන්න දෑ	76,663,031	(28,707,565)
වර්ෂ අවසානයේයේදී මුදල් හා මුදල්වලට ආසන්න දෑ ශේෂය	**(3,567,111)**	**76,663,031**

ක්‍රීඩාංගන අනුව ආදායම - 2017

ක්‍රීඩාංගනය	මෙහෙයුම් අදායම	මෙහෙයුම් නොවන ආදායම
සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනය	53,844,836	848,230
සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනය	24,933,858	419,120
ආර් ප්‍රේමදාස ක්‍රීඩාංගනය	3,000,000	-
බෝගම්බර ක්‍රීඩාංගනය	9,839,805	203,289
බෙලිඅත්ත පිහිණුම් තටාකය	723,753	17,959
නුවරඑළිය තුරඟ තරඟ පිටිය	5,125,816	12,280
දිගන ක්‍රීඩාංගනය	1,330,352	-
මුළු ආදායම	**98,798,421**	**1,500,879**

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

විගණකාධිපති වාර්තාව

2017

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. : සීඑෆ්/ඒ/එස්එන්එස්සීඒ/1/17/04
ඔබේ අංකය / உமது இல. / Your No. :
දිනය / திகதி / Date : 2018 ඔක්තෝබර් /5 දින

සභාපති,

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය.

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1999 අංක 17 දරන සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය පනතේ 9 (2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.auditorgeneral.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NAOSL NATIONAL AUDIT OFFICE

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිති වලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුමත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1

ප්‍රමිතයේ 48 වන වගන්තිය අනුව අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් හිලව් නොකළ යුතු වුවත්, එයට පටහැනිව රු.3,567,111 ක් වූ මුදල් පොතේ බැර ශේෂය (අයිරාව) ජංගම වගකීම් යටතේ දැක්වීම වෙනුවට මුදල් හා මුදල් සමාන දෑ වල ඇතුළත් කර ජංගම වත්කම්වලින් අඩු කර දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03

(i) ප්‍රමිතයේ 12 වන ඡේදය ප්‍රකාරව අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු.27,377,431 ක් වූ බොල් ණය වෙන් කිරීම සඳහා නිශ්චිත ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනා ගෙන නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 47 ඡේදය ප්‍රකාරව අස්තිත්වයක් විසින් ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේද වැරදි වරද සිදුවූ කාලපරිච්ඡේදය සඳහා ඉදිරිපත් කර ඇති සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමෙන් අතීතානුයෝගීව නිවැරදි කළ යුතු වුවත් එපරිදි කටයුතු කිරීමකින් තොරව 2016 වර්ෂයට අදාළ රු.4,424,606 ක් වූ පෙර වර්ෂ ගැලපීම් ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනයට ගැලපීම කර තිබුණි.

3

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඇ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7**

ප්‍රමිතයේ 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.මිලියන 472.3 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 09**

2017 දෙසැම්බර් 31 දිනට දීර්ඝ කාලයක සිට පැවත එන සෙමින් චලනය වන රු.1,296,163 ක් වූ තොග, පිරිවැයට දක්වා ඇතත්, එම තොග ප්‍රමිතයේ 15 වන ඡේදය ප්‍රකාරව පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකින් අඩු අගයට අගය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පතු හා සත්දින පොලී ගාස්තු ආදායම රු.1,450,747 ක් වුවද එය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ රු. 7,907,177 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ස්ථාවර තැන්පතු ආදායම රු.6,456,430 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව ස්ථාවර සහ සත්දින නිවේදන තැන්පත් ශේෂය රු.29,860,199 ක් වුවද බැංකු ශේෂ සනාථ කිරීම් අනුව එම වටිනාකම රු.29,850,879 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එම ශේෂය රු.9,320 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට විගණනයේදී සිදු කල ගණනය කිරීම අනුව ලැබිය යුතු සත්දින තැන්පතු පොලිය රු. 7,685,674 ක් වුවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ එම වටිනාකම රු.13,025,821 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ලැබිය යුතු පොලී රු.5,340,147 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම සඳහා ප්‍රතිපත්තියක් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන තිබුණද 2017 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ ප්‍රාග්ධන ශේෂය තුළ ඇතුළත් රු.3,749,785,477 ක ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමානුකූල පදනමක් මත ආදායමට ලියාහැරීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ලෙස දක්වා තිබූ එකතු කළ අගය මත බදු රු. 33,252,709 කින් රු. 44,609,847 ක් ප්‍රතිපූර්ණය කළ නොහැකි බව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් දන්වා තිබුණ ද එම වටිනාකම තවදුරටත් ලැබිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඊ) 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 3 වගන්තිය අනුව ගෙවා ඇති ආර්ථික සේවා බදු වර්ෂ 3 කට වඩා පැරණි නම් ගෙවිය යුතු ආදායම් බදු මුදලින් අඩු කළ නොහැකි බව දක්වා තිබුණද 2013 වර්ෂයේ සිට පැවත එන ආර්ථික සේවා ගාස්තු රු.679,535 ක් ලැබිය යුතු ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(උ) ක්‍රීඩා සංකීර්ණයේ වැඩ නිම වූ ව්‍යාපෘති 17 කට අදාල පිරිවැය රු.426,031,447 ක් ප්‍රාග්ධනිත කිරීමකින් තොරව නොනිමි වැඩ ලෙස දක්වා තිබීම හේතුවෙන් ගොඩනැගිලි පිරිවැය එම වටිනාකමින් සහ ක්ෂය රු.13,127,167 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයෙන් අයවිය යුතු ලෙස රු.3,332,206 ක් අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයේ ගිණුම් අනුව එම වටිනාකම රු.987,449 ක් වූයෙන් රු.2,344,757 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් අයවිය යුතු ලෙස රු.1,942,827 ක් අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුල දක්වා තිබුණද ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගිණුම් අනුව එවැනි බැරකමක් දක්වා නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් අයවිය යුතු ලෙස රු.16,553,844 ක් වෙළඳ ණයගැතියන් තුළ ඇතුළත් වුවද ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ගිණුම් අනුව ගෙවිය යුතු අගය රු.15,973,848 ක් වූයෙන් රු.579,999 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) 2017 දෙසැම්බර් 31 දිනට අනුව සේවක ණය ශේෂය රු.24,127,690 ක් වූ අතර අදාළ ණය උපලේඛනය අනුව එම ශේෂය රු.24,054,734 ක් වූයෙන් රු.72,956 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව උපචිත වියදම් හා ආපසු ගෙවිය යුතු තැන්පතු ශේෂය රු.24,938,220 ක් වුවද ඊට අදාල උපලේඛන අනුව එම ශේෂය රු. 23,958,220 ක් වූයෙන් රු.4,277,530 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම්

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය.

	ගිණුම් විෂයය	වටිනාකම රු.	ඉදිරිපත් නොකළ සාක්ෂි
(අ)	වෙළඳ ණයගැතියෝ	37,249,399	වයස් විශ්ලේෂණය සහ රු. 20,368,013 ක් සඳහා ශේෂ සනාථන
(ආ)	ආර්.ප්‍රේමදාස ක්‍රීඩාංගනයේ තොගය	2,149,491	උපලේඛන/ භෞතික සත්‍යාපන වාර්තා
(ඇ)	ස්ථාවර වත්කම්	4,915,015,139	භෞතික සත්‍යාපන වාර්තා / ස්ථාවර වත්කම් ලේඛනය
(ඈ)	මීටර් 400 ධාවන පථය සඳහා ගෙවිය යුතු මුදල	13,713,615	ශේෂ සනාථ කිරීම්

6

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වෙළඳ ගෙවිය යුතු ශේෂය තුළ ඇතුළත් වර්ෂ 04 ක කාලයක් ගත වී තිබුණු එකතුව රු.463,443 ක් වූ ගෙවිය යුතු ශේෂ 10 ක් නිරවුල් කිරීමට කටයුතුකර නොතිබුණි.

(ආ) 2012 සහ 2013 වර්ෂ සඳහා ගෙවිය යුතු එකතු කළ අගය මත බදු වෙනුවෙන් රු.8,939,262 ක් වෙන් කර තිබුණද එම බදු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීමට හෝ ගිණුම්වල නිරවුල් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඇ) වර්ෂ 11 ක කාලයක සිට කොළඹ මහනගර සභාවට ගෙවිය යුතු රු.1,124,068 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

විගණනයේදී නිරීක්ෂණය වූ නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

නීති රීති, රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම්
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
මුදල් රෙගුලාසි 880 හා 891 (1)	මුදල් අයකැමියන් ලෙස කටයුතු කරන නිලධාරීන්ගෙන් ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබුණ අතර අධිකාරිය විසින් ඇප ලේඛනයක්ද පවත්වාගෙන ගොස් නොතිබුණි.

7

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

(ආ) 1999 අංක 17 දරන සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරි පනතේ 13 වන වගන්තිය	කළමනාකරණ මණ්ඩලය මාසයකට වරක්වත් රැස්විය යුතු වුවත් 2017 අප්‍රේල්, ජූනි සහ සැප්තැම්බර් යන මාසවල කළමනාකරණ මණ්ඩල රැස්වීම් පවත්වා නොතිබුණි.
(ඇ) 2015 ජූලි 14 දිනැති අංක 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	කාර්ය නිම කළ විගසම ලබා ගත් අත්තිකාරම් නිරවුල් කළ යුතු වුවත් 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ගෙවා තිබූ රු.825,252 ක් වූ අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.154,960,050 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.117,402,554 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.37,557,496 කින් හෙවත් සියයට 32 කින් තවදුරටත් පිරිහී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව රාජ්‍ය ප්‍රදාන රු.40,240,000 කින් හෙවත් සියයට 25 කින් අඩුවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීම වැඩිවීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රතිඵලයේ ඌනතාවයක් ඇති වී අතර 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේදී ඌනතාවය අඩු වී තිබුණු නමුත් නැවතත් සමාලෝචිත වර්ෂයේදී රු.37,557,496 කින් වැඩි වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමිකය, ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සහ රාජ්‍ය බදු නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී රු.106,361,763 ක් වූ අධිකාරියේ දායකත්වය සමාලෝචිත වර්ෂය අවසානයට රු.125,701,859 ක් දක්වා වර්ධනය වී තිබුණි.

8

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී අධිකාරියේ ජංගම අනුපාතය 2.47 සිට 1.55 දක්වාද ක්ෂණික අනුපාතය 2.36 සිට 1.47 දක්වාද අඩු වී තිබුණි. ඒ අනුව ආයතනයේ කෙටිකාලීන බැරකම් පියවීමේ හැකියාව පෙර වර්ෂයට සාපෙක්ෂව පිරිහී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කළමනාකරණ ක්‍රියාකාරකම්

2008 හා 2012 වර්ෂවලදී අධිකාරිය විසින් රු. 24,919,980 ක් රාජ්‍ය බැංකුවක සත් දින නිවේදන තැන්පතු යටතේ ආයෝජන කර තිබුණු අතර එම මුදල් දිගුකාලීන ස්ථාවර තැන්පතුවල ආයෝජනය කළේ නම් ඉහළ පොළී අදායමක් ලබා ගැනීමට හැනියාව තිබූ බව විගණනයේදී නිරීක්ෂණය වූයෙන් ඒ අනුව අධිකාරියට මූල්‍යමය වශයෙන් වාසිදායක තත්ත්වයන් ලබා ගැනීමේ අවස්ථාව අහිමි වී තිබුණි.

4.2 නිෂ්ක්‍රිය හෝ ඌන උපයෝජිත වත්කම්

සුගතදාස ක්‍රීඩාංගනයේ පැවති රු.7,617,787 ක් වූ තොග තුළ (Indoor & Outdoor) 2006 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා මිලදී ගත් රු.1,080,319 ක් වූ තොග අභාවිතව හා ඌන උපයෝජිතව පැවති බව විගණනයේදී නිරීක්ෂණය විය.

5. තිරසාර සංවර්ධනය

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර "2030 න්‍යාය පත්‍රය" පිළිබඳව අධිකාරිය විසින් අන්තර්ජාලය මගින් දැනුවත් වී තිබුණද තම විෂයය පථය යටතට වැටෙන කාර්යයන්ට අදාළ තිරසාර සංවර්ධන අරමුණු ඉලක්ක හා එම ඉලක්ක කරා ලඟා විය යුතු ආකාරය හා ඉලක්ක මැන බැලීම සඳහා වන දර්ශකයන් හඳුනාගෙන නොතිබුණි. මේ සම්බන්ධයෙන් තිරසාර සංවර්ධන වැඩසටහන් හඳුනා ගනිමින් පවතින බව අධිකාරිය විසින් කරුණු දක්වා තිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

පද්ධති හා පාලන ක්ෂේත්‍ර	නිරීක්ෂණ
(අ) ණයගැති හා ණයහිමි පාලනය	(i) උපරිම ණයගැති සීමාව හා කාලය සම්බන්ධයෙන් සීමා නිර්ණය නොකිරීම.
	(ii) ණයගැතියන්ගේ ශේෂ සනාථන ලබා නොගැනීම.
	(iii) කලට වේලාවට ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ නිරවුල් නොකිරීම.
(ආ) ගිණුම්කරණය	(i) ස්ථාවර තැන්පත් පොලී නිවැරදිව ගණනය කර ගිණුම් ගත නොකිරීම.
	(ii) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු නොකිරීම.

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

10

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව සඳහා යාවත්කාලීන තොරතුරු

2.2.1 **ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති**

(අ) එකඟ වේ. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

(ආ) එකඟ වේ. බොල් ණය ප්‍රතිපත්තිය හඳුනාගෙන ඇති අතර, ඉදිරියේදී කළමනාකාරිත්ව මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කෙරේ.

(ඇ) එකඟ වේ. 2017.12.31 දිනට රු. 1,296,163.00ක් වූ දීර්ඝ කාලයක් පැවැති තොගය 2018.08.31 දිනට රු. 954,419.85 දක්වා අවශ්‍යතා හඳුනා ගනිමින් භාවිත කර ඇත. ඉදිරියේදී එම තොගයන්ද ප්‍රමිත අංක 09 හි 15 ට අනුව සිදු කිරීමට කටයුතු කෙරේ.

(ඈ) එකඟ වේ. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කෙරේ.

(ඉ) එකඟ වේ. වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට ඉදිරියේදී කටයුතු කෙරේ.

(ඊ) එකඟ වේ. වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට ඉදිරියේදී කටයුතු කෙරේ.

2.2.2 **ගිණුම්කරණ අඩුපාඩු**

(අ) එකඟ වේ. 2018.12.31 දිනට නිවැරදි කර ගැනීමට කටයුතු කර ඇත.

(ආ) එකඟ වේ. 2018.12.31 දිනට නිවැරදි කර ගැනීමට කටයුතු කර ඇත.

(ඇ) එකඟ වේ. 2018.12.31 දිනට නිවැරදි කර ගැනීමට කටයුතු කර ඇත.

(ඈ) එකඟ වේ. නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

(ඉ) එකඟ වේ.

(ඊ) එකඟ වේ. ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කර ඇත.

(උ) එකඟ වේ. ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කර ඇත.

(ඌ) එකඟ වේ. ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කර ඇත.

(එ) එකඟ වේ. ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කර ඇත.

2.2.3 <u>පැහැදිලි නොකළ වෙනස්කම්</u>

(අ) එකඟ වේ. 2018.12.31 දිනට නිවැරදි කර ගැනීමට කටයුතු කර ඇත.

(ආ) එකඟ වේ. ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කර ඇත.

(ඇ) එකඟ වේ. ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කර ඇත.

(ඈ) එකඟ වේ. ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කර ඇත.

(ඉ) එකඟ නොවේ. ස්ථාවර වත්කම් ලේඛනය සමඟ ලෙජරය සංසන්දනය වේ.

2.2.4 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

(අ) එකඟ වේ. 2018.12.31 දිනට නිවැරදි කර ගැනීමට කටයුතු කර ඇත.

(ආ) එකඟ වේ. ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කර ඇත.

(ඇ) එකඟ වේ. ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කර ඇත.

(ඈ) එකඟ වේ. ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කර ඇත.

(ඉ) එකඟ වේ. ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කර ඇත.

(උ) එකඟ වේ.

(ඌ) ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කර ඇත.

(එ) එකඟ නොවේ.

(ඒ) එකඟ වේ. 2018.12.31 දිනට නිවැරදි කර ගැනීමට කටයුතු කර ඇත.

2.3 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

(අ) එකඟ වේ. 2018.08.18 දින ගත් කළමනාකාරීත්ව මණ්ඩල තීරණයට කපා හැරීමට තීරණය කර ඇත.

(ආ) එකඟ වේ. ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කර ඇත.

(ඇ) එකඟ වේ. ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කර ඇත.

2.4 <u>නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්</u>

(අ) එකඟ වේ. ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කර ඇත.

(ආ) එකඟ වේ. නමුත් 2017 මාර්තු මාසයේදී 02 වෙනි දින සහ 14 වෙනි දින කළමනාකාරීත්ව මණ්ඩල රැස්වීම් දෙකක් පවත්වා ඇත. ඒ අනුව රැස්වීම් පවත්වා නැත්තේ ජුනි සහ සැප්තැම්බර් මාසවලදීය.

(ඇ) එකඟ වේ. එම මුදලින් රු. 552,958.00ක මුදලක් 2018.09.15 දින වන විට පියවා ඇත. මේ පිළිබඳව 2018.09.11 දින පැවැති විගණන හා කළමනාකාරීත්ව මණ්ඩල රැස්වීමේ සාකච්ඡා කළ පරිදි මේ වන තෙක් පියවා නොමැති අත්තිකාරම් මුදල් අදාළ නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කරන ලෙස එම නිලධාරීන් විසින් අංශ ප්‍රධානීන්ට උපදෙස් ලබා දී ඇති බැවින් ඒ පිළිබඳව සොයා බලා අත්තිකාරම් මුදල් පියවීමට කටයුතු කරනු ලැබේ.

3. **<u>මූල්‍ය සමාලෝචනය</u>**

3.1 **<u>මූල්‍ය ප්‍රතිඵල</u>**

එකඟ වේ.

3.2 **<u>විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය</u>**

එකඟ වේ.

4. **<u>මෙහෙයුම් සමාලෝචනය</u>**

4.1 **<u>කළමනාකරණ ක්‍රියාකාරකම්</u>**

එකඟ වේ. 2018 අප්‍රේල් මාසයේදී වරද නිවැරදි කර සත්දින නිවේදන තැන්පතු අවලංගු කර ස්ථාවර තැන්පතු ලෙස ආයෝජනය කර ඇත.

4.2. **<u>නිශ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම්</u>**

2017.12.31 දිනට රු. 1,080,319ක් වූ තොග ප්‍රමාණය සඳහා එකඟ වේ. 2018.08.31 දින වන විට එම තොගයේ ශේෂය වන්නේ රු. 954,419.85කි.

5. **<u>තිරසාර සංවර්ධනය</u>**

එකඟ වේ. ඉදිරියේදී තිරසාර අරමුණු වෙනුවෙන් වැඩි අවධානයක් යොමු කිරීමට අදහස් කරගෙන ඇත.

6. **<u>පද්ධති හා පාලනයන්</u>**

(අ) **<u>ණයගැති හා ණයහිමි පාලනය</u>**

(i) එකඟ වේ. ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කර ඇත.

(ii) එකඟ වේ. ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කර ඇත.

(iii) එකඟ වේ. ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කර ඇත.

(ආ) **<u>ගිණුම්කරණය</u>**

(i) එකඟ වේ. ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කර ඇත.

(ii) එකඟ වේ. ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කර ඇත.

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය,
තැ.පෙ.2211, ආතර් ද සිල්වා මාවත,
කොළඹ 13.

දුරකථන : 0112 384 385 / 0112 384 490
ෆැක්ස් : 0112 44 56 75
විද්‍යුත් තැපැල් : sugathadasaindoor@gmail.com

බෝගම්බර ක්‍රීඩාංගනය : 081 22 35 395
නුවරඑළිය තුරඟ තරඟ පිටිය : 052 22 22 659
බෙලිඅත්ත පිහිණුම් තටාකය : 047 22 51 685